11

# බුද්ධ ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

(2016 වසරේ සිට ක්‍රියාත්මක වේ.)

ශ්‍රේණිය

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**ජාතික අධ්‍යාපන ආයතනය**
මහරගම, ශ්‍රී ලංකාව

**Web**| www.nie.lk **Email**| info@nie.lk

# බුද්ධ ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 11 ශ්‍රේණිය

**(2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**


**ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**ශ්‍රී ලංකාව**

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

බුද්ධ ධර්මය

11 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2016

C ජාතික අධ්‍යාපන ආයතනය

ISBN: ......................

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය :

මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2016 වර්ෂයේ දී හත්වන සහ එකොළොස්වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන , පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය
ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** : කථිකාචාර්ය, පූජ්‍ය උඩුගම සුදස්සී හිමි
ව්‍යාපෘති නායක

**විෂය කමිටුව** :

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු කථිකාචාර්ය
අතිපූජ්‍ය ගන්තුනේ අස්සජී මහානායක හිමිපාණෝ
සබරගමුව පළාත් බුද්ධ ධර්මය විෂය අධ්‍යක්ෂ පූජ්‍ය කණුගල පඤ්ඤාලංකාර හිමිපාණෝ
අධ්‍යාපන අමාත්‍යාංශයේ ආගමික හා සාරධර්ම අධ්‍යාපන ශාඛාවේ
අධ්‍යාපන අධ්‍යක්ෂ එස්.බී.එම්. නිමල් ධර්මසිරි මහතා
කෑගල්ල අධ්‍යාපන කලාපයේ ගුරු උපදේශක ඩබ්.ඒ.සී. වේරගොඩ මහත්මිය
කොළඹ 10,ගෝතමී බාලිකා මහා විද්‍යාලයේ ආචාරිනී ඒ. ඩබ්ලිව්. එම්. අනුරා වීරසූරිය මහත්මිය
ගා/ඕපාත මහා විද්‍යාලයේ ආචාර්ය එස්. ආර්. සමරවික්‍රම මහතා

**ලේඛක මණ්ඩලය** :

කැලණිය විශ්වවිද්‍යාලයේ බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනයේ
කථිකාචාර්ය, පූජ්‍ය මඩිහේ සුගතසිරි හිමි
ජාතික අධ්‍යාපන ආයතනයේ කථිකාචාර්ය, පූජ්‍ය උඩුගම සුදස්සී හිමි
ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු කථිකාචාර්ය, එස්. පී. විතාන මයා
බප/ජය/ඉහළ බෝමිරිය කනිටු විදුහලේ විදුහල්පති උදයරුවන් මල්ලිකාරච්චි මහතා
පිළියන්දල අධ්‍යාපන කලාපයේ ගුරු උපදේශක එල්. එන්. ඒ. වීරසිංහ මහතා
රත්නපුර අධ්‍යාපන කලාපයේ ගුරු උපදේශක වයි. පී. පී. කවිසිගමුව මහත්මිය
කිරිල්ලවල මධ්‍ය විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති කේ. කේ. සාගරිකා වික්‍රමආරච්චි මහත්මිය

**විෂය සංස්කරණය** :

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු කථිකාචාර්ය
අතිපූජ්‍ය ගන්තුනේ අස්සජී මහානායක හිමිපාණෝ

**භාෂා සංස්කරණය** :

ඩබ්ලිව්. කරුණාරත්න මයා, කථිකාචාර්ය, ගුරු මධ්‍යස්ථානය, ගිරාගම, පිළිමතලාව.

**පරිගණක වදන් සැකසුම** :

මංගලිකා විජේරත්න මහත්මිය, කළමනාකරණ සහකාර 1, ජාතික අධ්‍යාපන ආයතනය

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

බෞද්ධාගමික ඉගැන්වීම්වලට අනුකූල ව සාර්ථක ජීවිතයක් පවත්වා ගැනීමට සුදුසු වන පරිදි, අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොට ගෙන, පාසල් අධ්‍යාපනය හරහා එකී නිපුණතා සංවර්ධනය කර ගැනීම උදෙසා මගපෙන්වීමට මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

දැනුමින් පමණක් පෝෂිත ව, දැනුම් කේන්ද්‍රීය විභාග ක්‍රමයක් යටතේ ඉහළ සාමාර්ථ්‍යයක් ලැබුව ද එය ප්‍රමාණවත් නො වේ. සාර්ථක අධ්‍යාපන ක්‍රමයක දී හිස මෙන් ම හද හා අත ද පෝෂණය වීම අත්‍යවශ්‍ය වේ. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම ගුරු මාර්ගෝපදේශය සම්පාදනයේ දී අපේක්ෂා කර ඇත.

පාඩමට ප්‍රවේශය වඩාත් වැදගත් වන බැවින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබා දීම වැදගත් වේ. පාඩමේ සංවර්ධනයට අදාළ කරගත හැකි යෙදවුම්, ගුණාත්මක යෙදවුම් යන්නෙන් අදහස් කෙරේ.

- පාඩමට අදාළ ව සංයුක්ත තැටි, පරිගණකය, බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය (Multi Media)
- චිත්‍ර , ගීත, පුවත් පත්, සඟරා, ඇටවුම්, ප්‍රතිමා, මූර්ති, කැටයම්, ඡායාරූප
- පෙළ පොත, ලියන පුවරුව, කඩදාසි, විවිධ වර්ණ ඇතුළත් තීන්ත පෑන්, චලන රූප, කාන්දම් රඳවනය, පැනල් පුවරුව
- අදාළ කරගත හැකි වෙනත් සම්පත්

කණ්ඩායම් ක්‍රියාකාරකමක දී ශිෂ්‍ය කණ්ඩායමක සිටිය යුතු ප්‍රශස්ත සංඛ්‍යාව 07ක් ලෙස සැලකෙන බැවින් ඊට ගැළපෙන පරිදි සංවිධානය වීම වැදගත් ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඊට වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීමට ගුරුවරයා උනන්දු විය යුතු ය. (උදා. විහාරස්ථානය, පාසලේ බුදු මැදුර, රුක් සෙවණක් ආදි) පාඩමට (ක්‍රියාකාරකමට) පිවිසීමේ දී ප්‍රබෝධාත්මක ආරම්භය, පෙර අත්දැකීම් හා පාඩම පිළිබඳ කුතුහලය යන කරුණු ගැන සැලකිලිමත් වෙමින් ප්‍රදේශයේ සංස්කෘතික පසුබිම කෙරෙහි ද අවධානය යොමු විය යුතු ය. ශ්‍රද්ධාව ජනනය වන පරිදි ශාසනික වචන භාවිතය පිළිබඳ සැලකිලිමත් වන්න.

මෙහි ඇතුළත් පාඩම්වලට යෝජිත ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිත කිරීම අනිවාර්ය නොවන අතර විකල්ප ඉගෙනුම් ක්‍රම, සුදුසු පරිදි භාවිත කළ හැකි ය. එහෙත් නිපුණතාව හා නිපුණතා මට්ටමෙන් බැහැර නොවිය යුතු ය. ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යහපත් ආගමික ආකල්ප වර්ධනය කෙරෙහි ද ප්‍රායෝගික අවස්ථා යොදා ගැනීම කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කරන්න.

පාඩම ආරම්භයේ සිට අවසානය දක්වා තක්සේරුව සිදු කළ යුතු අතර හැකියා නො හැකියා අනුව ප්‍රතිපෝෂණය හා ඉදිරි පෝෂණය ලබා දිය යුතු ය. කණ්ඩායම් ගවේෂණ ක්‍රියාවලියෙන් අනාවරණය කර ගන්නා ඉගෙනුම් පල අභ්‍යාස පොත්වල කෙටියෙන් සටහන් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න. බොහෝ විට කාල සටහන් සැකසීමේ දී කාලච්ඡේද දෙකක් එකවර නොලැබෙනු ඇත. එබැවින් අදාළ පාඩම කළමනාකරණය කර ගැනීම ඔබ සතු වගකීමකි. අදාළ පාඩමට අපේක්ෂිත ඇගයුම, තක්සේරුව හා ඇගයීම් නිර්ණායක අනුව සකස් කර ගන්න. ඔබ විසින් සිසුන්ට ලබා දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කොට සටහන් තබන්න.

සෑම පාඩම් සටහනක් අවසානයේ ම යොදා ඇති ගෙදර පරිසරයෙන් යන කොටස දෙමාපිය වැඩිහිටි සහභාගිත්වය යටතේ සිදු කරන්නට යෝජිත ය. ඒ සඳහා අදාළ උපදෙස්, විදුහල්පති විසින් පාසල් සංවර්ධන සමිතියේ දී ද, විෂය භාර ගුරු භවතා විසින් පන්ති කවවල දී ද දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ලබා දීමට කටයුතු කළ යුතු ය.

**කථිකාචාර්ය**
**ශාස්ත්‍රපති පූජ්‍ය උඩුගම සුදස්සී හිමි**
**ව්‍යාපෘති නායක**

| පටුන | පිටුව |
| --- | --- |


| | |
| --- | --- |
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | ii |
| විෂයමාලා කමිටුව | iii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | iv |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | vii |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1– 49 |
| විවිධ සහාය | 50 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

## විෂය හැඳින්වීම

බුදු දහමෙහි විෂය කරුණු ප්‍රායෝගිකත්වයට නැඹුරු කරවීම අන් කවර යුගයකටත් වඩා වර්තමානයේ අත්‍යවශ්‍ය ව පවතී. හුදු වනපොත්කරණයෙන් හා දහම් කරුණු හැදෑරීමෙන් ඔබ්බට ගොස් දෛනික ජීවිතයේ මුහුණ දීමට සිදු වන විවිධ ගැටලුවල දී ඒවාට සාර්ථක ව මුහුණ දීම සඳහා දහම් කරුණු භාවිතයට නැඹුරු කරවීම අතිශය වැදගත් වේ.

බුද්ධ ධර්මය විෂය සඳහා පාසල් කාලසටහනෙහි වෙන් වී ඇත්තේ සතියකට කාලච්ඡේද දෙකක් වුව ද එම කාලය වඩාත් අර්ථවත් ව හා ඵලදායී ව යොදා ගැනීම දහම් ගුරු භවතාගේ වගකීමකි. සමබර පෞරුෂයකින් හෙබි පුරවැසියකු බිහි කිරීම සඳහා බුද්ධ ධර්මය විෂය නිර්දේශයෙහි දැක්වෙන නිපුණතා අත්පත් කර ගැනීමට මහෝපකාරී වේ.

නව සහස්‍රකයේ පළමු විෂයමාලා ප්‍රතිසංස්කරණයෙහි අත්දැකීම් ද පාදක කොට ගනිමින් වඩාත් ගුණාත්මක පරිවර්තනයක් ඇති කිරීමටත් දෛනික ජීවිතයේ දී සැබෑ බෞද්ධයකු ලෙස දරුවාට කටයුතු කිරීමටත් විචාරශීලි මනසකින් හෙබි දැහැමි පුද්ගලයකු බිහිකිරීමටත් විෂය නිර්දේශය මග පාදනු ඇතැයි අපේක්ෂා කෙරේ.

6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය තෙක් විෂය නිර්දේශය පොදු නිපුණතා 10කින් සමන්විත වන අතර, ඒ ඒ ශ්‍රේණියට ගැළපෙන නිපුණතා මට්ටම්වලින් ද එම නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට වඩාත් උචිත විෂය සන්ධාරයකින් ද සමන්විත ය. ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයේ දී නිපුණතා මට්ටම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කොට එම නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගත හැකි පරිදි විෂය සන්ධාරයට අදාළ කරුණු හරවත් ව පෙළ ගස්වා, සිසුන්ට ඉදිරිපත් කළ යුතු වේ. මෙම විෂය නිර්දේශයෙන් සැබවින් ම දරුවා සක්‍රීය ඉගෙනුමක් කරා ගෙන යාමටත් වඩාත් ප්‍රත්‍යක්ෂකරණයකට යොමු කිරීමෙන් දරුවන් තුළ දැහැමි බව වර්ධනය කිරීමටත් අපේක්ෂා කරනු ලැබේ. හැකි තරම් ප්‍රායෝගික අත්දැකීම්වලින් නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට සංවිධානය කිරීම ගුරුභවතුන් ඇතුළු විෂය භාර සියලු දෙනාගේ වගකීම වේ.

## ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

### ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහය හා ක්‍රියාවලිය තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා  වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුම්වත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන්  සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන  සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමිකර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා**

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   **සාක්ෂරතාව** සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

   **සංඛ්‍යා පිළිබඳ දැනුම** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

   **රූපක භාවිතය** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද, සේවා පරිශ්‍රයන් තුළදී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   **සමාජ පරිසරය** ජාතික උරුමය පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

   **ජෛව පරිසරය** සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

   **භෞතික පරිසරය** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත්වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

4. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

   ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම. යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

5. **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

   පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

6. **ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

   සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

7. **ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**

   සීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## විෂයයේ අරමුණු

(1) ත්‍රිවිධ රත්නයේ ගුණ හැඳින, ශ්‍රද්ධාවෙන් කටයුතු කරන, නිවැරදි ව ප්‍රායෝගික වතාවත්වල යෙදෙන දැහැමි දරු පරපුරක් බිහිකිරීම.

(2) ජීවන ගමනේ දී මුහුණ දෙන අභියෝග ජය ගැනීමට සහ නිවැරදි ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීමට බුදු දහමෙහි මූලික ඉගැන්වීම් උපයෝග කර ගැනීම පිණිස දරු පරපුරට මග පෙන්වීම.

(3) සුපෞරුෂයක් ගොඩනගා ගැනීම උදෙසා බෝසත් චරිතය, බුද්ධ චරිතය හා සිව්වනක් පිරිසට අයත් ශ්‍රේෂ්ඨ චරිත ආදර්ශ කොට ගැනීම සඳහා මග පෙන්වීම.

(4) ශ්‍රී ලාංකික උරුමය දායාද කොට ගත් අභිමානවත්, වගකීමෙන් සහ වගවීමෙන් යුතු දරු පරපුරක් ගොඩනගා ගැනීම.

(5) සිය ජීවන දර්ශනය ගොඩනගා ගැනීමේ දී ධම්මපද දේශනා සහ බෞද්ධ උපදේශ කාව්‍යය පදනම් කරගත් ඉගැන්වීම් චරිතායනයට මග පෙන්වීම.

(6) මානසික ඒකාග්‍රතාවෙන් යුතු සුසමාහිත පෞරුෂයක් ගොඩනගා ගැනීම සඳහා භාවනාව ප්‍රගුණ කිරීමට යොමු කරවීම.

(7) බෞද්ධ ශිෂ්ටාචාරයෙහි සුවිශේෂ අංග අධ්‍යයනය කොට, සහජීවනයෙන් කටයුතු කරන සිය අනන්‍යතාව රැක ගත් දරු පරපුරක් ගොඩනගා ගැනීම.

## විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි | **11.1.1 බුදු සිරිතේ සුවිශේෂී සිදුවීම් ආදර්ශයට ගනිමින් ජීවිත අභියෝගවලට සාර්ථකව මුහුණ දෙයි** | සත්සතියෙන් හෙළි වන ආදර්ශ, ප්‍රථම ධර්ම දේශනය ආශ්‍රිත කරුණු, තනතුරු ප්‍රදානය, මාතෘ දිව්‍ය පුත්‍රයාට දහම් දෙසීම, ඝෝෂිතාරාම සිදුවීම, වේරඤ්ජාවේ වස් විසීම, ආරාම පිළිගැනීම හා පරිහරණය | • බුදු සිරිතේ සුවිශේෂී අභියෝගාත්මක අවස්ථා නම් කරයි.<br>• අභියෝගයන්ට සාර්ථක ව මුහුණ දිය යුතු බව පිළිගනියි.<br>• බුදුසිරිතේ අභියෝගාත්මක අවස්ථා පෙළ ගස්වයි.<br>• ශිෂ්‍ය ජීවිතයේ දී බුදු සිරිතේ ගුණාංග ආදර්ශයට ගනී.<br>• ගැටලුවලට මුහුණදීමේ දී ඉවසීම ප්‍රගුණ කරයි. | 02 |
| | **11.1.2 බුදු සිරිතේ සුවිශේෂී ගුණාංග හැඳින ජීවිතාදර්ශ ලබා කටයුතු කරයි.** | පුරිසදම්මසාරථී ගුණය, අසරණ සරණ ගුණය, ගිලානෝපස්ථානය, තාදි ගුණය | • බුදු සිරිතේ සුවිශේෂී ගුණාංග නිදසුන් මගින් පැහැදිලි කරයි.<br>• ආදර්ශවත් ජීවිතයක් සඳහා බුදු සිරිතේ ගුණාංග මහෝපකාරී වන ආකාරය පෙන්වා දෙයි.<br>• අන්‍යයන්ට පිහිට විය හැකි අවස්ථා ලැයිස්තු ගත කරයි.<br>• අසරණ අයට හා ගුණ නුවණින් අඩු අයට උදවු උපකාර වෙයි.<br>• අන් අය කෙරෙහි සැලකිලිමත් වෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 ජීවන රටාව හැඩ ගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි. | **11.2.1බුද්ධ කාරක ධර්ම ඇසුරින් බෝසත් දිවියක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි.** | දස පාරමිතා | • බුද්ධ කාරක ධර්ම අරුත් සහිත ව අනුපිළිවෙළින් දක්වයි.<br>• බෝධි සත්ව ජීවිතයකට බුද්ධ කාරක ධම්ම උපකාරී වන බැව් පිළිගනියි.<br>• දානං සීලං ච නෙක්ඛම්මං ගාථාව නිවැරදි ව මතකයෙන් සජ්ඣායනය කරයි.<br>• බෝසත් දිවියකට හුරු වෙයි.<br>• යහපත් අරමුණක් ඉටුකර ගැනීම සඳහා ප්‍රතිපත්ති පූරණයෙහි යෙදේ. | 02 |
| | **11.2.2 සමථ හා විපස්සනා භාවනාවන්හි ප්‍රයෝජන හැඳින භාවනාවේ යෙදෙයි.** | සමථ භාවනාවේ ප්‍රභේද, භාවනාවේ ප්‍රයෝජන, චිත්ත ඒකග්‍රතාව, මෙත්තානිසංස, සෞඛ්‍යය, නිර්වාණාවබෝධය | • සමථ හා විපස්සනා භාවනා පිළිබඳ මූලික කරුණු ඉදිරිපත් කරයි.<br>• භාවනාවෙන් ලැබෙන චිත්ත ඒකාග්‍රතාව ලෞකික, ලෝකෝත්තර දියුණුවට බලපාන බව පිළිගනියි.<br>• ''භාවනාවේ ප්‍රයෝජන '' යන මැයෙන් උපදෙස් පත්‍රිකාවක් සකස් කරයි.<br>• තෝරාගත් භාවනාවක දෛනික ව නිරත වේ.<br>• එකඟ වූ සිතින් කටයුතු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | **11.2.3** ශ්‍රාවක ශ්‍රාවිකා චරිත ඇසුරින් ජීවිතාදර්ශ ලබා කටයුතු කරයි. | • පූජ්‍ය රේරුකානේ චන්දවිමල මහ නාහිමි, අනගාරික ධර්මපාලතුමා | • පූජ්‍ය රේරුකානේ චන්දවිමල මහ නාහිමි හා අනගාරික ධර්මපාලතුමාගේ ජීවන තොරතුරු පැහැදිලි කරයි.<br>• මෙම චරිත දෙකෙන් ජීවිතාදර්ශ රැසක් ලබා ගත හැකි බව පෙන්වා දෙයි.<br>• රේරුකානේ චන්ද විමල මහ නාහිමි සහ අනගාරික ධර්මපාල තුමාගේ චරිත තුළ පවතින ගුණාංග ඇසුරින් කතාවක් පවත්වයි.<br>• ආදර්ශවත් චරිත කතා අධ්‍යයනය කරයි.<br>• දේශානුරාගී හා ශාසනමාමක ජීවිතයක් ගත කරයි. | 02 |
| | **11.2.4** ධම්මපදයෙන් ආදර්ශ ගෙන යහපත් ජීවිතයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි. | • භය ශ්‍රේණියේ සිට දහය ශ්‍රේණිය තෙක් නිර්දිෂ්ට ගාථා සමෝධානය | • ධම්ම පදය පිළිබඳ මූලික හැඳින්වීමක් කරයි.<br>• ධම්ම පද උපදේශ ඇසුරින් ආදර්ශවත් ජීවිතයක් ගත කළ හැකි ආකාරය පෙන්වා දෙයි.<br>• නිර්දිෂ්ට ධම්ම පද ගාථා නිවැරදි ව සජ්ඣායනය කරයි.<br>• ධමම පදයේ උපදේශ අනුගමනය කරයි.<br>• දෛනික ජීවිතයේ දී පඩිවදන් ගුරු කොට ගනියි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි | 11.3.1 සීලය පාදක කර ගනිමින් පුද්ගල සමාජීය හා භෞතික සංවර්ධනය උදෙසා කටයුතු කරයි. | • සීලයේ ප්‍රභේද ඇසුරින් පුද්ගල හා සමාජ සංවිධානය, භෞතික සම්පත් පරිහරණය | • සීලය හා එහි ප්‍රභේද සමාලෝචනය කරයි.<br>• සිල්වත් වීමෙන් පුද්ගල සමාජ හා භෞතික සංවර්ධනය අත්පත් කර ගත හැකි බව පෙන්වා දෙයි.<br>• සීලයේ ප්‍රභේද ඊ සටහනක දක්වයි.<br>• විනය ගරුකව කටයුතු කරයි.<br>• ධර්මානුකූලව සම්පත් කළමනාකරණය කරයි. | 02 |
| | 11.3.2 සූත්‍ර ධර්ම ඇසුරින් තම ජීවිතය හැඩගසා ගැනීමට ක්‍රියා කරයි. | • ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, මහා මංගල සූත්‍රය, පරාභව සූත්‍රය | • ව්‍යග්ඝ පජ්ජ, මහා මංගල, පරාභව යන සූත්‍රවල ඇතුළත් මෙලොව දියුණුවට හේතු වන කරුණු ඉදිරිපත් කරයි.<br>• අදාළ සූත්‍ර ධර්ම ඇසුරින් මෙලොව ජීවිතය සාර්ථකව ගත කළ හැකි ආකාරය පෙන්වා දෙයි.<br>• මෙම සූත්‍ර ධර්මවල එන සමාන කරුණු ගෙනහැර දක්වමින් කතාවක් පවත්වයි.<br>• ජීවිතයට යහපත් දේ එකතු කර ගනියි.<br>• අර්ථවත් ජීවිතයක් ගත කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි. | 11.4.1බුදු දහමේ ඉගැන්වීම් අනුව නිවැරදි චින්තනයෙන් හා විමර්ශනශීලී බවින් යුතු ව කටයුතු කරයි. | • කාලාම සූත්‍රය | • කාලාම සූත්‍රයේ නිදාන කතාව හා එහි අන්තර්ගතය කෙටියෙන් පවසයි.<br>• සිතීමේ හා විමසීමේ නිදහස අගය කරයි.<br>• ශිෂ්‍ය ජීවිතයේ දී සිතා විමසා කටයුතු කිරීමේ අගය දක්වමින් කතාවක් පවත්වයි.<br>• ඉගෙනීමේ දී විමසිලිමත් ව කටයුතු කරයි.<br>• විමර්ශනශීලී ජීවිතයක් ගත කරයි. | 02 |
| 5.0 ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි | 11.5.1බෞද්ධ සංකල්ප ඇසුරින් ශ්‍රී ලාංකික අනන්‍යතාව සුරකියි. | • මනුෂ්‍යත්වයේ ඒකත්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්, ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව (බෞද්ධ කොඩිය, ධර්ම චක්‍රය) | • ශ්‍රී ලාංකික අනන්‍යතාව පැහැදිලි කරයි.<br>• බෞද්ධ ඉගැන්වීම් ඔස්සේ ගොඩනැගිය යුතු ශ්‍රී ලාංකික අනන්‍යතාව කුමක්දැයි පෙන්වා දෙයි.<br>• ශ්‍රී ලාංකික අනන්‍යතාව පෙන්නුම් කරන දෙබසක් නිර්මාණය කරයි.<br>• අන්‍යෝන්‍ය සුහදත්වයෙන් යුතුව කටයුතු කරයි.<br>• මනුෂ්‍යත්වයේ ඒකත්වය පිළිගනිමින් සැමට සම අයිතිය තහවුරු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි. | **11.6.1 කර්මය පුනර්භවයට බලපාන ආකාරය ගවේෂණය කර පාපයෙන් වැළකී කුසල කර්මයන්හි යෙදෙයි.** | කර්මය හා පුනර්භවය (ප්‍රායෝගික නිදසුන්) නිබ්බේධික සූත්‍රය | • කර්මය සහ පුනර්භවය අර්ථ දක්වයි.<br>• කර්මය සහ පුනර්භවය අතර මනා සබඳතාවක් ඇති බැව් පිළිගනියි.<br>• චූල්ල කම්ම විභංග සූත්‍රය ඇසුරෙන් පුද්ගල විවිධත්වයට හේතු වන කරුණු වගුගත කරයි.<br>• ශිෂ්‍යයෙකු ලෙස යහපත් චර්යා රටා ගොඩනගා ගැනීමට ක්‍රියා කරයි.<br>• කර්මානුරූපීව ඵල විපාක ලැබෙන බව දැන සදාචාරවත් ජීවිතයක් ගත කරයි. | 02 |
| | **11.6.2 පටිච්ච සමුප්පාද න්‍යායට අනුව සාංසාරික දුක තේරුම් ගෙන නිවැරදි ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීමට ක්‍රියා කරයි.** | ද්වාදසාංගය (අනුලෝම ව හා ප්‍රතිලෝම ව දැක්වීම) | • ද්වාදසාංග පටිච්ච සමුප්පාදය පැහැදිලි කරයි.<br>• සෑම සංසිද්ධියක්ම හේතුඵල සබඳතාව අනුව සිදුවන බව පිළිගනියි.<br>• ද්වාදසාංග පටිච්ච සමුප්පාදය අනුලෝමව හා ප්‍රතිලෝමව ලියා දක්වයි.<br>• සිසු ජීවිතයේ ජය ගැනීම් සඳහා ප්‍රතීත්‍ය සමුප්පාද න්‍යාය යොදා ගනියි.<br>• සමාජ ජීවිතයේ දී හමුවන ගැටලු බුද්ධිමත්ව නිරාකරණය කර ගනියි. | 02 |
| | **11.6.3 බුදුදහමේ මූලික ඉගැන්වීම් පදනම් කරගනිමින් තම ජීවිතය ඔපවත් කර ගනියි.** | මූලික ඉගැන්වීම් යටතේ දැක්වෙන මාතෘකා (චතුරාර්ය සත්‍යය, පටිච්ච සමුප්පාදය, කර්මය හා පුනර්භවය) | • බුදු දහමේ මූලික ඉගැන්වීම් සමාලෝචනය කරයි.<br>• බුදු දහමේ මූලික ඉගැන්වීම් ඇසුරෙන් යහපත් ජීවිත දර්ශනයක් ගොඩනගා ගත හැකි බව පිළිගනියි.<br>• බුදු දහමේ මූලික ඉගැන්වීම් සංකල්ප සිතියමක් මගින් පැහැදිලි කරයි.<br>• ජීවිත ජය ගැනීමට බුදු දහමේ මූලික ඉගැන්වීම් උපයෝගී කර ගනියි.<br>• නිවැරදි දැක්මෙන් කටයුතු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 ජීවී අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි. | 11.7.1 ජීව අජීව පරිසරය පිළිබඳ බෞද්ධ ඇගයීම් මතු කරමින් පරිසර හිතකාමී ව ක්‍රියා කරයි. | පරිසරය හා සම්බන්ධ බෞද්ධ ඉගැන්වීම්, වනරෝප සූත්‍රය | • ජීව අජීව පරිසරය පිළිබඳ ව බෞද්ධ ඉගැන්වීම් ගෙන හැර දක්වයි.<br>• පරිසරයට හිතකාමීව ක්‍රියා කළ යුතු බව පිළිගනියි.<br>• ජීව අජීවී පරිසර සුරක්ෂිත කිරීමට සැලසුම් කරයි.<br>• පරිසර හිතකාමී ලෙස ගෙවතු පරිසරය සකස් කරයි.<br>• පරිසර හිතකාමීව කටයුතු කරයි. | 02 |
| | 11.7.2 බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් හෙළි වන නිරෝගී දිවි පෙවෙත වටහාගෙන කායික මානසික සමබරතාවක් ඇති කර ගනියි. | සම්බුද්ධ දේශනා, ශ්‍රාවක ශ්‍රාවිකා භාෂණ, ධම්මපදය හා විනය නීති, ථෙර ථෙරී ගාථා | • නීරෝගී දිවි පෙවෙතක් ගත කිරීමට ඇවැසි බෞද්ධ ඉගැන්වීම් ඉදිරිපත් කරයි.<br>• කායික මානසික සමබරතාවට බෞද්ධ ඉගැන්වීම් ගුරු කොට ගත හැකි බව පිළිගනියි.<br>• බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් නීරෝගීතාව පවත්වා ගැනීමට අවශ්‍ය තොරතුරු ඇතුළත් දහම් පත්‍රිකාවක් සකස් කරයි.<br>• තම පවිත්‍රතාව පිළිබඳ ව සැලකිලිමත් වෙයි.<br>• නීරෝගීමත් ජීවිතයක් ගත කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි. | **11.8.1 බෞද්ධ ථෙරවාදී සංගායනා අධ්‍යයනය කොට ථෙරවාද සම්ප්‍රදාය රැක ගැනීමට දායක වෙයි.** | පළමු, දෙවන, තෙවන හා මාතලේ අලුවිහාර සංගායනා සංක්ෂිප්තව | • බෞද්ධ ථෙරවාදී සංගායානා අධ්‍යයනය කරයි.<br>• බුදු සසුන රැක ගැනීමට සංගායනා ඉවහල් වූ බැව් පිළිගනියි.<br>• පළමු, දෙවන, තෙවන සහ මාතලේ අලුවිහාර සංගායනා හි වැදගත් කරුණු වගුගත කරයි.<br>• ගැටලු සහගත අවස්ථා සාකච්ඡා මගින් විසඳා ගනියි.<br>• බුදු දහමේ චිරස්තිථිය උදෙසා කටයුතු කරයි. | 02 |
| | **11.8.2 මහින්දාගමනයෙන් ශ්‍රී ලාංකික ජන ජීවිතය ඔපවත් වූ ආකාරය අගයමින් සරල හා දැහැමි දිවි පෙවෙතකට හුරු වෙයි.** | මහින්දාගමනය හා දුමින්දාගමනය<br>මහින්දාගමනයෙන් හා දුමින්දාගමනයෙන් ලත් දායාද සහ පුද සිරිත් | • මහින්දාගමනයේ සහ දුමින්දාගමනයේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• ශ්‍රී ලාංකික ජන ජීවිතය ඔපවත් වීමට මහින්දාගමනය හේතු වූ බැව් පිළිගනියි.<br>• මහින්දාගමනයෙන් සහ දුමින්දාගමනයෙන් ලත් දායාද වගුගත කරයි.<br>• සරල - දහැමි දිවි පෙවෙතක් ගත කරයි.<br>• බෞද්ධ සංස්කෘතික දායාද රැක ගනියි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | **11.8.3 ශාසන ඉතිහාසයෙන් උරුම වූ මූර්ති හා චිත්‍ර අගයමින් සංරක්ෂණය කිරීමට දායක වෙයි.** | ප්‍රතිමා වර්ග, ආසන, මුද්‍රා, ප්‍රතිමාසර මහනුවර හා නූතන යුගයේ චිත්‍ර | • ශාසන ඉතිහාසයෙන් උරුම වූ චිත්‍ර සහ මූර්තිවලට නිදසුන් සපයයි.<br>• මෙම දායාද සංරක්ෂණය කර ගත යුතු බව පෙන්වා දෙයි.<br>• ප්‍රතිමා, ප්‍රතිමා සර, මුද්‍රා, ආසන සහ මහනුවර යුගයේ හා නූතන යුගයේ චිත්‍ර, රූප සටහන් මගින් නිරූපනය කරයි.<br>• ශාසනික උරුමයන් හඳුනා ගැනීමට අධ්‍යාපන හා වන්දනා චාරිකා යොදා ගනියි.<br>• ශාසනික උරුමයන් සංරක්ෂණය කරයි. | 02 |
| | **11.8.4 බුදු දහම ඇසුරින් පෝෂණය වූ සිංහල සාහිත්‍යය රසාස්වාදනය කරමින් එහි සංරක්ෂණයට දායක වෙයි** | යාපහුව, කුරුණෑගල, ගම්පල, කෝට්ටේ, මහනුවර හා නූතන යුගයන් හි ගද්‍ය, පද්‍ය සාහිත්‍යය | • යාපහුව, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ, මහනුවර සහ නූතන යුගයන්හි සාහිත්‍ය කෘති නම් කරයි.<br>• බුදු දහම ඇසුරින් සිංහල සාහිත්‍යය පෝෂණය වීම අගය කරයි.<br>• යාපහුව සිට නූතන යුගය දක්වා බිහිවූ සාහිත්‍ය කෘති යුග වශයෙන් වෙන් කොට දක්වයි.<br>• සාහිත්‍ය රසාස්වාදනයෙහි යෙදේ.<br>• නිර්මාණකරණයට යොමු වේ. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳිනගෙන ඒ අනුව ක්‍රියා කරයි. | **11.9.1 රැකියා නියුක්තියේ දී හා මුදල් පරිහරණයේ දී ධාර්මික ක්‍රමෝපායයන් පිළිබඳ මූලික හුරුව ලබයි.** | චතුර්විධ සැප ධාර්මික ධනෝපායනය | • චතුර්විධ සැපය හා ධාර්මික ධනෝපායනය කුමක්දැයි පැහැදිලි කරයි.<br>• උපයන ධනය ධාර්මික විය යුතු බව පෙන්වා දෙයි.<br>• ''ධාර්මිකව ධනය ඉපයීමේ වැදගත්කම'' යන මාතෘකාව යටතේ ලිපියක් ලියයි.<br>• ශ්‍රමාභිමානීව කටයුතු කරයි.<br>• මානසික සුවය අත් විඳියි. | 02 |
| | **11.9.2 උපයා ගත් ධනය තමාගේ හා අන්‍යයන්ගේ යහපත පිණිස යෙදවිය යුතු බව දැන ඊට අනුගතව ක්‍රියා කරයි.** | පත්තකම්ම සූත්‍රයේ ප්‍රාප්ත කර්ම | • අංගුත්තර නිකායේ පත්ත කම්ම සූත්‍රයේ දැක්වෙන ප්‍රාප්ත කර්ම පහ පැහැදිලි කරයි.<br>• උපයා ගත් ධනය තමාගේ හා අන්‍යයන්ගේ යහපත සඳහා යෙදවිය යුතු බව පිළිගනියි.<br>• පත්ත කම්ම සූත්‍රයේ ප්‍රාප්ත කර්ම රූප සටහනක් මගින් නිරූපනය කරයි.<br>• තමා උපයන සම්පත් අර්ථවත් ව පරිහරණය කරයි.<br>• අරපිරිමැස්මෙන් පරිභෝජනය කරයි. | 02 |
| | **11.9.3 බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති අධ්‍යයනය කොට තම ජීවිතයේ නායකත්ව අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දෙයි.** | දස රාජ ධර්ම පංච ශීල ප්‍රතිපත්තිය, සිව් බඹ විහරණ | • බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති පැහැදිලි කරයි.<br>• නායකත්ව අවස්ථාවන්ට මුහුණ දීමේ දී බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති ගුරු කොට ගත හැකි බව පෙන්වා දෙයි.<br>• දස රාජ ධර්ම, සිව් බඹ විහරණ, පංච සීල ප්‍රතිපත්තිය ලැයිස්තු ගත කරයි.<br>• නිවැරදි නායකත්වයට ගරු කරයි.<br>• දෛනික ක්‍රියාකාරකම්හි දී නායකත්ව ලක්ෂණ පෙන්වයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 10.0 නිර්වාණය අරමුණු කොටගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි. | **11.10.1 නිර්වාණගාමී ප්‍රතිපදාවේ සුවිශේෂත්වය තේරුම් ගෙන එම ප්‍රතිපදාවේ නියැලෙයි.** | සම්මා දිට්ඨිය නිවන් මගට පූර්වාංගම වන බව | • නිර්වාණගාමී ප්‍රතිපදාවේ දී සම්මා දිට්ඨිය පූර්වාංගම වන ආකාරය පැහැදිලි කරයි.<br>• ශික්ෂණය සඳහා සම්මා දිට්ඨියේ අවශ්‍යතාව පෙන්වා දෙයි.<br>• '' සම්මා දිට්ඨිය නිවන් මගෙහි පදනමයි'' යන මැයෙන් පුවත්පත් ලිපියකට අවශ්‍ය කරුණු පෙළගස්වයි.<br>• නිවැරදි දැක්මෙන් ක්‍රියා කරයි.<br>• ලොවී ලොව්තුරා සුව පිණිස කටයුතු කරයි. | 02 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 01 :** තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 11.1.1 :** බුදු සිරිතේ සුවිශේෂී සිදුවීම් ආදර්ශයට ගනිමින් ජීවිත අභියෝගවලට සර්ථක ව මුහුණ දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- බුදු සිරිතේ සුවිශේෂී අභියෝගාත්මක අවස්ථා නම් කරයි.
- අභියෝගයන්ට සාර්ථක ව මුහුණ දිය යුතු බව පිළිගනියි.
- බුදුසිරිතේ අභියෝගාත්මක අවස්ථා පෙළගස්වයි.
- ශිෂ්‍ය ජීවිතයේ දී බුදු සිරිතේ ගුණාංග ආදර්ශයට ගනී.
- ගැටලුවලට මුහුණදීමේ දී ඉවසීම ප්‍රගුණ කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

සත්සතිය ගත කිරීම, ප්‍රථම ධර්ම දේශනය, තනතුරු ප්‍රදානය, මාතෘ දිව්‍ය පුත්‍රයාට දහම් දෙසීම, සෝෂිතාරාම සිදුවීම, වේරඤ්ජාවේ වස් විසීම, ආරාම පිළිගැනීම සහ පරිහරණය යන අවස්ථා ඇසුරින් ජීවිත අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය යුතු ආකාරය පිළිබඳ සිසුන්ට මගපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- '' පඨමං බෝධි පල්ලංකං .......................... '' යන සත්සති වන්දනා ගාථාව ඉදිරිපත් කරමින් එයින් කියැවෙන කරුණු මතු කරන්න.
- සත්සතිය ගත කිරීමේ දී බුදුරජාණන් වහන්සේ මුහුණ දුන් ගැටලු පිළිබඳ ව විමසන්න.
- බුදුරජාණන් වහන්සේ එම ගැටලුවලට සාර්ථක ව මුහුණ දුන් ආකාරය පැහැදිලි කරන්න.
- තවත් එවැනි අභියෝගාත්මක අවස්ථා රැසකට බුදුරජාණන් වහන්සේ මුහුණ දුන් බව පැහැදිලි කරන්න.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - ප්‍රථම ධර්ම දේශනය සිදු කිරීමේ දී බුදුරජාණන් වහන්සේ තමාට මුහුණදීමට සිදු වූ අභියෝග ජයගත් බව.

- තනතුරු ප්‍රදානයේදී, පෞද්ගලික හිතවත්කම නොතකා සුදුස්සාට ම තනතුරු හිමි කර දුන් බව.
- බුදුරජාණන් වහන්සේ මාතෘත්වයට සැලකීම සඳහා මාතෘ දිව්‍ය පුත්‍රයාට දහම් දෙසීම උදෙසා දිව්‍ය ලෝකයට වැඩම කළ බව.
- ඝෝෂිතාරාමයේ ඇති වූ ගැටලුව විසඳීමේ දී අවස්ථාවෝචිත ව කටයුතු කළ බව.
- ලාභ සත්කාර ලැබීම හෝ අහිමිවීම යන අවස්ථා දෙක තුළදීම අකම්පිත ව කටයුතු කළ බව
- බුදු සිරිතේ ඉහත අභියෝගාත්මක අවස්ථා අධ්‍යයනය කිරීමෙන් ජීවිතයට එල්ලවන අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය හැකි බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

පහත දැක්වෙන අවස්ථාවල දී බුදුරජාණන් වහන්සේ මුහුණ දුන් අභියෝග මොනවා දැයි පන්තියට ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 1.
- i. සත්සතිය ගත කිරීම
- ii. පළමු ධර්ම දේශනය
- iii. තනතුරු ප්‍රදානය

කණ්ඩායම 2.
- i. ඝෝෂිතාරාම සිදුවීම
- ii. වේරංජාවේ වස් විසීම
- iii. ආරාම පිළිගැනීම හා පරිහරණය

කණ්ඩායම 3. බුදුරජාණන් වහන්සේ අභියෝගවලට මුහුණදුන් ආකාරය ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට උපයෝගී කර ගත හැකි බවට කරුණු දක්වන්න.

**ගෙදර පරිසරයෙන්** : එදිනෙදා මුහුණදීමට සිදුවන අභියෝග ජය ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දරුවා සමග සාකච්ඡා කොට ක්‍රියාත්මක කරන්න.

**නිපුණතාව 01** : තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 11.1.2** : බුදු සිරිතේ සුවිශේෂී ගුණාංග හැඳින ජීවිතාදර්ශ ලබා කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- බුදු සිරිතේ සුවිශේෂී ගුණාංග නිදසුන් මගින් පැහැදිලි කරයි.
- ආදර්ශවත් ජීවිතයක් සඳහා බුදු සිරිතේ ගුණාංග මහෝපකාරී වන ආකාරය පෙන්වා දෙයි.
- අන්‍යයන්ට පිහිට විය හැකි අවස්ථා ලැයිස්තු ගත කරයි.
- අසරණ අයට හා ගුණ නුවණින් අඩු අයට උදවු උපකාර වෙයි.
- අන් අය කෙරෙහි සැලකිලිමත් වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

පුරිසදම්ම සාරථී ගුණය, අසරණ සරණ ගුණය, ගිලානෝපස්ථානය හා තාදි ගුණය ඇසුරින් ජීවිතාදර්ශ ලබාදීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලද අසරණයින් පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- ඒ ඇසුරින් වඩාත් කැමති කතාවක් සිසුන් ලවා පන්තියට ඉදිරිපත් කරවන්න.
- අසරණ සරණ ගුණයෙහි වැදගත්කම කුමක් දැයි සිසුන්ගෙන් අසන්න.
- බුදු සිරිතේ තවත් එබඳු ගුණාංග රැසක් ඇති බව පැහැදිලි කරන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - පුරිසදම්ම සාරථී ගුණය, ගිලානෝපස්ථානය හා තාදි ගුණය වැදගත් වන බව.
  - අංගුලිමාල, ආලවක, සුචිරෝම, ඛරරෝම ආදී විෂම පුද්ගලයන් බුදුරජාණන් වහන්සේ දමනය කළ බව.
  - කෙත පාළු වූ ගොවියා, කිසා ගෝතමී, පටාචාරා, රජ්ජුමාලා, සුනීත, සෝපාක වැනි චරිත බුදුරජාණන් වහන්සේ අසරණයිනට පිහිට වූ අවස්ථාවලට නිදසුන් බව.
  - පූතිගත්ත තිස්ස තෙරුන්ට හා උදරාබාධයෙන් පෙළුණු භික්ෂුවට බුදුරජාණන් වහන්සේ සියතින් ම සත්කාර කළ බව.

- චිංචාමානවිකා, මාගන්දියා, වේරංජාපුර උදය බමුණා යන අයගේ ක්‍රියා කලාප හමුවේ උන්වහන්සේ අකම්පිත ව වැඩ විසූ බව
- බුදුරජාණන් වහන්සේ මෙම සුවිශේෂී අවස්ථා හමුවේ ක්‍රියා කළ ආකාරයෙන් ජීවිතාදර්ශ රැසක් ලබා ගත හැකි බව
- එම ජීවිතාදර්ශ චරිතායනය කිරීමෙන් සාර්ථක ජීවිතයක් ගත කළ හැකි බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

බුදු සිරිතේ පහත දැක්වෙන ගුණාංග කෙටියෙන් හඳුන්වා එක් ගුණාංගයක් කාලීන සමාජ සිදුවීමක් ඇසුරින් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 1.
i. ගිලානෝපස්ථානය
ii. පුරිසදම්ම සාරථී ගුණය
iii. අසරණ සරණ ගුණය

කණ්ඩායම 2. පුරිසදම්ම සාරථී, අසරණ සරණ වීම, ගිලානෝපස්ථානය හා තාදි ගුණය යන ගුණාංග බුද්ධ චරිතය මඟින් ප්‍රකට වන අවස්ථා පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. ආදර්ශවත් ජීවිතයක් ගත කිරීම සඳහා බුදු සිරිතේ ගුණාංග මහෝපකාරී වන ආකාරය පෙන්වා දෙන්න.

**ගෙදර පරිසරයෙන්** :

සමාජයේ සිටින අසරණ අය නිවැරදි ව හඳුනාගෙන ඔවුන්ට පිහිටවීමට දරුවා සමඟ යොමුවන්න.

**නිපුණතාව 02 :** ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 11.2.1 :** බුද්ධකාරක ධර්ම ඇසුරින් බෝසත් දිවියක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- බුද්ධ කාරක ධර්ම අරුත් සහිත ව අනුපිළිවෙළින් දක්වයි.
- බෝධි සත්ව ජීවිතයකට බුද්ධ කාරක ධර්ම උපකාරී වන බව පිළිගනියි.
- ''දානං සීලං ච නෙක්ඛම්මං ................'' ගාථාව නිවැරදි ව මතකයෙන් සජ්ඣායනය කරයි.
- බෝසත් දිවියකට හුරු වෙයි.
- යහපත් අරමුණක් ඉටුකර ගැනීම සඳහා ප්‍රතිපත්ති පූරණයෙහි යෙදේ.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

දස පාරමිතා අධ්‍යයනය කොට බෝසත් දිවියක් ගත කිරීමට මග පෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- ''දානං සීලං ච නෙක්ඛම්මං .......................... '' ගාථාව සිසුන් සමග සජ්ඣායනා කරන්න.
- බුද්ධත්වයට පෙරුම් පුරන බෝධි සත්ත්වයෙකු ප්‍රගුණ කරන ගුණාංග 10ක් මෙම ගාථාවෙන් පැවසෙන බව පැහැදිලි කරන්න.
- මෙම ගුණාංග බුද්ධ කාරක ධර්ම නැතහොත් පාරමිතා ලෙස හැඳින්වෙන බව පැහැදිලි කරන්න.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බෝසත්වරුන් දාන, සීල, නෙක්ඛම්ම ආදී පාරමිතා ධර්ම 10ක් පිරිය යුතු බව.
  - පරමී, උපපාරමී, පරමත්ථ පාරමී ලෙස පාරමිතා සමතිස් වන බව
  - බුදු, පසේබුදු, මහරහත් භාවයට පාරමිතා ධර්ම ආකාර තුනකින් පූරණය කළ යුතු බව
  - පාරමිතා අධ්‍යයනය කිරීමෙන් ජීවිතාදර්ශ රැසක් ලබා ගත හැකි බව.
  - බෝසත් දරුවන් ලෙස පාරමිතා ධර්ම ප්‍රගුණ කළ යුතු බව.
  - බෝසතාණන් වහන්සේ පාරමිතා පූරණය කළ අයුරු ජාතක කතාවලින් දැක්වෙන බව.
  - බුද්ධකාරක ධර්ම ඇසුරින් යහපත් ජීවිතයකට මග පෑදෙන බව.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. එක් එක් පාරමිතා අර්ථ දක්වා ඒවා සමතිස් වන ආකාරය වගු ගත කරන්න.

කණ්ඩායම 2. දාන, ශීල, නෛෂ්ක්‍රම්‍ය, ප්‍රඥා සහ වීර්ය පාරමිතා සඳහා ජාතක කතාවලින් නිදසුන් දක්වමින් ගත හැකි ජීවිතාදර්ශ පෙන්වා දෙන්න.

කණ්ඩායම 3. ක්ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී හා උපේක්ෂා පාරමිතා සඳහා ජාතක කතාවලින් නිදසුන් දක්වමින් ගත හැකි ජීවිතාදර්ශ පෙන්වා දෙන්න.

**ගෙදර පරිසරයෙන්** :

පාරමිතා ධර්ම ඇසුරින් බෝසත් දරුවකු ලෙස දෛනික කාර්යයන්හි යෙදීමට දරුවන් පොලඹවන්න.

**නිපුණතාව 02** : ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 11.2.2**: සමථ හා විපස්සනා භාවනාවන්හි ප්‍රයෝජන හැඳින භාවනාවේ යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- සමථ හා විපස්සනා භාවනා පිළිබඳ මූලික කරුණු ඉදිරිපත් කරයි.
- භාවනාවෙන් ලැබෙන චිත්ත ඒකාග්‍රතාව ලෞකික, ලෝකෝත්තර දියුණුවට බලපාන බව පිළිගනියි.
- ''භාවනාවේ ප්‍රයෝජන '' යන මැයෙන් පත්‍රිකාවක් සකස් කරයි.
- තෝරාගත් භාවනාවක දෛනික ව නිරත වේ.
- එකඟ වූ සිතින් කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

භාවනාවේ ප්‍රභේද දැනගෙන භාවනාවේ ප්‍රයෝජන වන චිත්ත ඒකාග්‍රතාව, මෙත්තානිසංස, සෞඛ්‍යය හා නිර්වාණාවබෝධය යන ප්‍රතිඵල හැඳින භාවනාවට පෙලඹවීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- භාවනානුයෝගී ඉරියවුවෙන් සිටින අයකුගේ හෝ පිරිසකගේ පින්තූරයක් සිසුන්ට පෙන්වා, ඒ ඇසුරින් පහත සඳහන් කරුණු පිළිබඳ සාකච්ඡාවක යෙදෙන්න.
- පින්තූරයෙන් නිරූපණය වන්නේ කුමක් දැයි අසන්න.
- කුසල් සිත වැඩීම භාවනාව බව පෙන්වා දෙන්න.
- භාවනාවේ ප්‍රයෝජන හැඳින එහි ප්‍රායෝගිකව යෙදීම සාර්ථක ජීවිතයකට ඉවහල් වන බව පැහැදිලි කරන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - සමථ හා විපස්සනා වශයෙන් භාවනාවේ ප්‍රධාන කොටස් දෙකක් ඇති බව
  - සමථ භාවනාවට අයත් කර්මස්ථාන 40ක් ඇති බව
  - සමථ භාවනාව වැඩීමෙන් පංච නීවරණ යටපත් වන බව
  - විපස්සනා භාවනාව යනු ත්‍රිලක්ෂණය මෙනෙහි කිරීම බව

- නිර්වාණාවබෝධයට උපකාර වන්නේ විපස්සනා භාවනාව බව
- කායික - මානසික සෞඛ්‍යය රැක ගැනීමට භාවනාව ඉවහල් වන බව
- විපස්සනා භාවනාව වැඩීමෙන් නිර්වාණය අවබෝධ කර ගත හැකි බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. සමථ භාවනාව හඳුන්වා එහි ප්‍රයෝජන පන්තියට ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 2. විපස්සනා භාවනාව හඳුන්වා එහි ප්‍රයෝජන පන්තියට ඉදිරිපත් කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

සවස බුද්ධ වන්දනාවෙන් පසු දරුවන් සමඟ භාවනාවක නිරතවන්න.

**නිපුණතාව 02** : ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 11.2.3** : ශ්‍රාවක ශ්‍රාවිකා චරිත ඇසුරින් ජීවිතාදර්ශ ලබා කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- පූජ්‍ය රේරුකානේ චන්ද්‍රවිමල මහ නාහිමි හා අනගාරික ධර්මපාලතුමාගේ ජීවන තොරතුරු පැහැදිලි කරයි.
- මෙම චරිත දෙකෙන් ජීවිතාදර්ශ රැසක් ලබා ගත හැකි බව පෙන්වා දෙයි.
- රේරුකානේ චන්ද්‍රවිමල මහ නාහිමි සහ අනගාරික ධර්මපාල තුමාගේ චරිත තුළ පවතින ගුණාංග ඇසුරින් කතාවක් පවත්වයි.
- ආදර්ශවත් චරිත කතා අධ්‍යයනය කරයි.
- දේශානුරාගී හා ශාසනමාමක ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

පූජ්‍ය රේරුකානේ චන්ද්‍රවිමල මහ නාහිමියන්ගේ හා ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමාගේ චරිත මඟින් සිසුන්ගේ ජීවිත සාර්ථක කර ගැනීමට මගපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- මෑත යුගයේ ජාතික සහ ආගමික වශයෙන් රටට සේවයක් කළ ගිහි පැවිදි පඬිවරුන් පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- පූජ්‍ය රේරුකානේ චන්ද විමල මහ නාහිමි සහ අනගාරික ධර්මපාලතුමා ද ඒ පඬිවරුන් අතර වන බව පෙන්වා දෙන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - පූජ්‍ය රේරුකානේ චන්ද්‍රවිමල නාහිමියන් විනය ගරුක හා අල්පේච්ඡ ජීවිතයක් ගත කළ බව.
  - පූජ්‍ය රේරුකානේ චන්ද්‍රවිමල මහ නාහිමියන් සරල බසින් බෞද්ධ පතපොත රචනා කරමින් ධර්මය ව්‍යාප්ත කරනු සඳහා කැප වූ පඬිරුවනක් බව

- අනගාරික ධර්මපාල තුමා කුඩා කල සිටම මනා අධ්‍යාපනයක් ලැබූ බව.
  - අනගාරික ධර්මපාලතුමා පරගැති සිරිත්වලින් ලාංකිකයන් මුදවා ගැනීමට ක්‍රියා කළ වීරයකු බව
  - එතුමා ඉන්දියාවේ බුද්ධගයාව ඇතුළු බෞද්ධ සිද්ධස්ථාන රැක ගැනීම සඳහා විශාල කාර්ය භාරයක් ඉටු කළ බව
  - ජීවිතයෙහි අවසන් කාලයෙහි එතුමා සිරිදේවමිත්ත ධර්මපාල නමින් පැවිදි දිවියට ඇතුළත් වූ බව
  - මෙම චරිත දෙකෙහි ආදර්ශ හැඳින ජීවිතයට එක් කර ගත යුතු බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. පූජ්‍ය රේරුකානේ චන්දවිමල මහ නාහිමි චරිතය අධ්‍යයනය කොට ලබා ගත හැකි ජීවිතාදර්ශ පෙන්වා දෙන්න.

කණ්ඩායම 2. අනගාරික ධර්මපාල තුමාගේ චරිතය අධ්‍යයනය කොට ලබා ගත හැකි ජීවිතාදර්ශ පෙන්වා දෙන්න.

**ගෙදර පරිසරයෙන්** :

ආදර්ශවත් ගිහි පැවිදි චරිත කතා දරුවන්ට කියා දී, ඒ අනුව චරිතය හැඩ ගසා ගැනීමට දරුවන් පොලඹවන්න.

**නිපුණතාව 02** : ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 11.2.4**: ධම්මපදයෙන් ආදර්ශ ගෙන යහපත් ජීවිතයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- ධම්ම පදය පිළිබඳ මූලික හැඳින්වීමක් කරයි.
- ධම්ම පදය උපදේශ ඇසුරින් ආදර්ශවත් ජීවිතයක් ගත කළ හැකි ආකාරය පෙන්වා දෙයි.
- නිර්දිෂ්ට ධම්ම පද ගාථා නිවැරදි ව සජ්ඣායනය කරයි.
- ධමම පදයේ උපදේශ අනුගමනය කරයි.
- දෛනික ජීවිතයේ දී පඬි වදන් ගුරු කොට ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

6 ශ්‍රේණිය සිට 10 ශ්‍රේණිය දක්වා නිර්දිෂ්ට ධම්ම පද ගාථා අධ්‍යයනය කොට යහපත් ජීවිතයක් ගොඩනගා ගැනීමට මගපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- ''උට්ඨානවතෝ සතිමතෝ .............'' ධම්ම පද ගාථාව සිසුන් සමග නිවැරදිව සජ්ඣායනය කරන්න. පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.
- මෙම ගාථාව අන්තර්ගත ධම්ම පදය පිළිබඳ මූලික හැඳින්වීමක් කරන්න.
- අදාළ ගාථාවේ දියුණුවට ඉවහල් වන කරුණු හත පෙන්වා දෙන්න.
- ධම්ම පද ගාථාවලින් ජීවිතාදර්ශ ලැබිය හැකි බව පෙන්වා දෙන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - ධම්ම පදය සරල, සුගම උපදේශාත්මක ග්‍රන්ථයක් බව
  - එය ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථයක් බව
  - එහි ගාථා 423ක් වන අතර, ඒවා වර්ග 26ට බෙදෙන බව
  - ධම්ම පදය වැදගත් බෞද්ධ ඉගැන්වීම් සම්පිණ්ඩනයක් බව

- ස්වාමීන් වහන්සේලා ධර්ම දේශනා සඳහා බහුල ව ගුරු කොට ගන්නා ග්‍රන්ථයක් බව
- අදාළ ගාථාවලින් උපදේශ රැසක් ලබා දෙන බව
- යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා ධම්ම පද ගාථා ගුරු කොට ගත හැකි බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

ඔබේ කණ්ඩායමට ලැබෙන ගාථා දෙක නිවැරදිව සජ්ඣායනය කරන්න. සරල අදහස පවසන්න. ජීවිතාදර්ශ මතු කර දක්වන්න.

කණ්ඩායම 1. ''අක්කොච්ඡි මං අවධි මං '' ගාථා ද්වය

කණ්ඩායම 2. ''තං ච කම්මං කතං සාධු''
''න තං කම්මං කතං සාධු'' ගාථා ද්වය

කණ්ඩායම 3. ''අත්තනාව කතං පාපං''
''සුකරානි අසාධූනි'' ගාථා ද්වය

කණ්ඩායම 4. ''අචරිත්වා බ්‍රහ්මචරියං'' ගාථා ද්වය සහ
''උට්ඨානවතෝ සතිමතෝ'' ගාථාව

**ගෙදර පරිසරයෙන්** :
දෛනික බුද්ධ වන්දනයෙන් අනතුරු ව ධම්ම පදයේ අඩංගු එක් ගාථාවක් බැගින් කියවා ඉන් ලබා දෙන උපදේශ පිළිබඳ ව දරුවන් සමඟ සාකච්ඡා කරන්න.

**නිපුණතාව 03** : බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.

**නිපුණතා මට්ටම 11.3.1** : සීලය පාදක කර ගනිමින් පුද්ගල, සමාජීය හා භෞතික සංවර්ධනය උදෙසා කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- සීලය හා එහි ප්‍රභේද සමාලෝචනය කරයි.
- සිල්වත් වීමෙන් පුද්ගල සමාජ හා භෞතික සංවර්ධනය අත්පත් කර ගත හැකි බව පෙන්වා දෙයි.
- සීලයේ ප්‍රභේද ඊ සටහනක දක්වයි.
- විනය ගරුකව කටයුතු කරයි.
- ධර්මානුකූලව සම්පත් කළමනාකරණය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

සීලයේ ප්‍රභේද අධ්‍යයනය කොට පුද්ගල සමාජ හා භෞතික සම්පත් පරිහරණය උදෙසා සිසුන්ට මගපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- පුද්ගල හා සමාජ සංවර්ධනයට බලපාන සිදුවීමක් ඇසුරින් සැකසුණු පුවත් පත් වාර්තාවක් පන්තියට ඉදිරිපත් කරන්න.
- අදාළ පුවත්පත් වාර්තාවේ සිදුවීම පුද්ගල හා සමාජ සංවර්ධනයට ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න.
- යහපතට හේතු වන ක්‍රියා සීලයට ද අයත් වන ආකාරය පෙන්වා දෙන්න.
- සීලයේ ප්‍රභේද ලුහුඬින් පහදන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - කය වචනයේ සංවරය සීලය බව
    - පන්සිල්, අටසිල්, ආජීව අෂ්ටමක සිල් ...................... ආදී වශයෙන් ගිහි සීලය ප්‍රභේද ගත වන බව
    - සීලයෙන් පුද්ගල සංවර්ධනය සිදු වන බව

- පුද්ගල සංවර්ධනය සමාජ සංවර්ධනයට ඉවහල් වන බව
- නිවැරදි සීලයක පිහිටා භෞතික සම්පත් ඉපයීම හා පරිභෝජනය කළ යුතු බව
- නිවැරදි ලෙස සම්පත් පරිහරණයට සීලය උපයෝගී වන බව
- සීලයෙහි පිහිටා කටයුතු කිරීම නිවැරදි ජීවිතයක් ගත කිරීමට හේතු වන බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. ගිහි සීලයේ ප්‍රභේද වගු ගත කොට දක්වන්න.

කණ්ඩායම 2. සීලයෙන් පුද්ගල හා සමාජ සංවර්ධනය සිදු වන ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. භෞතික සම්පත් පරිහරණයේ දී සීලය පෙරටු කර ගත යුතු ආකාරය ඉදිරිපත් කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

පන්සිල්වලට අනුගත වෙමින් දෛනික කටයුතු සිදු කිරීම සඳහා දරුවා සමඟ යොමුවන්න.

**නිපුණතාව 03** : බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.

**නිපුණතා මට්ටම 11.3.2** : සූත්‍ර ධර්ම ඇසුරින් තම ජීවිතය හැඩගසා ගැනීමට ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- ව්‍යග්ඝපජ්ජ, මහා මංගල, පරාභව යන සූත්‍රවල ඇතුළත් මෙලොව දියුණුවට හේතු වන කරුණු ඉදිරිපත් කරයි.
- අදාළ සූත්‍ර ධර්ම ඇසුරින් මෙලොව ජීවිතය සර්ථක ව ගත කළ හැකි ආකාරය පෙන්වා දෙයි.
- මෙම සූත්‍ර ධර්මවල එන සමාන කරුණු ගෙනහැර දක්වමින් කතාවක් පවත්වයි.
- ජීවිතයට යහපත් දේ එකතු කර ගනියි.
- ආදර්ශවත් ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

ව්‍යග්ඝපජ්ජ, මහා මංගල හා පරාභව සූත්‍ර ඇසුරින් මෙලොව ජීවිත හැඩගසා ගැනීමට මගපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- ''අසේවනා ච බාලානං ...................'' යන ගාථාව ලියූ පුවරුවක් සිසුන්ට ඉදිරිපත් කරන්න.
- මෙය මහා මංගල සූත්‍රයේ ඇතුළත් ගාථාවක් බව පවසන්න.
- බාලයන් ඇසුරු නොකිරීම, පඬිවරුන් ඇසුර, පිදිය යුත්තන් පිදීම යන මංගල කරුණු මෙම ගාථාවේ සඳහන් වන බව පැහැදිලි කරන්න.
- එදිනෙදා ජීවිතයට මගපෙන්වන මෙවැනි සූත්‍ර දේශනා රැසක් සූත්‍ර පිටකයේ ඇති බව පෙන්වා දෙන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - ව්‍යග්ඝපජ්ජ සූත්‍රය දීඝජානු කෝලිය පුත්‍රයාට දේශනා කොට ඇති බව.
    - එහි මෙලොව දියුණුවට හේතු වන කරුණු 4ක් ඉගැන්වෙන බව.
    - මංගල කරුණු පිළිබඳ ව විවාදාපන්න අවස්ථාවක් මුල් කර ගෙන දිව්‍ය පුත්‍රයෙකුට මංගල සූත්‍රය දේශනා කොට ඇති බව

- මහා මංගල සූත්‍රයේ සඳහන් කරුණු 38න් මෙලොව දියුණුවට හේතු වන කරුණු 32ක් ඇති බව
- පරාභව සූත්‍රයේ පිරිහීමට හේතුවන කරුණු 21ක් ඇතුළත් බව
- මෙම සූත්‍රානුගත දේශනාවලින් තම ජීවිතය හැඩ ගසා ගැනීමට බොහෝ දහම් කරුණු උගත හැකි බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

පහත දැක්වෙන සූත්‍රවල නිදාන කතා දක්වා එම සූත්‍රවල ඇතුළත් කරුණු මෙලොව ජීවිතය හැඩගසා ගැනීමට උපයෝගී කර ගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

කණ්ඩායම 1. ව්‍යග්ඝ පජ්ජ සූත්‍රය

කණ්ඩායම 2. මහා මංගල සූත්‍රය

කණ්ඩායම 3. පරාභව සූත්‍රය

**ගෙදර පරිසරයෙන්** :

දෛනික බුද්ධ වන්දනයෙන් අනතුරු ව මහා මංගල සහ පරාභව යන සූත්‍රවල ඇතුළත් ගාථාවක අර්ථය දරුවන් ලවා ප්‍රකාශ කරවන්න.

**නිපුණතාව 04** : සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනඟා ගැනීමට කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 11.4.1** : බුදු දහමේ ඉගැන්වීම් අනුව නිවැරදි චින්තනයෙන් හා විමර්ශනශීලී බවින් කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- කාලාම සූත්‍රයේ නිදාන කතාව හා එහි අන්තර්ගතය කෙටියෙන් පවසයි.
- සිතීමේ හා විමසීමේ නිදහස අගය කරයි.
- ශිෂ්‍ය ජීවිතයේ දී සිතා විමසා කටයුතු කිරීමේ අගය දක්වමින් කතාවක් පවත්වයි.
- ඉගෙනීමේ දී විමසිලිමත් ව කටයුතු කරයි.
- විමර්ශනශීලී ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

කාලාම සූත්‍රයට අනුව නිවැරදි චින්තනයෙන් හා විමර්ශනශීලී බවින් යුක්ත ව කටයුතු කිරීමට සිසුන්ට මගපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- අපරීක්ෂ්‍යකාරී බවින් සිදුවූ විපතක් දැක්වෙන පුවත්පත් වාර්තාවක් පන්තියට ඉදිරිපත් කරන්න.
- සිතීමෙන් හා විමසීමෙන් තොරව කටයුතු කිරීම නිසා මෙවැනි ආදීනවයන්ට මුහුණදීමට සිදුවන බව පෙන්වා දෙන්න.
- සිතීමේ හා විමසීමේ නිදහස බුදු දහම අගය කොට ඇති බව පහදන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුදුරජාණන් වහන්සේ කේස පුත්ත නියම් ගමේ කාලාම වැසියන්ට මෙම සූත්‍රය දේශනා කළ බව
  - සිතීමේ හා විමසීමේ නිදහසට බාධා වන කරුණු 10ක් කාලාම සූත්‍රයේ අඩංගු බව
  - යහපත අයහපත තෝරා ගැනීමේ දී සැලකිය යුතු නිර්ණායක 4ක් කාලාම සූත්‍රයේ දැක්වෙන බව
  - සිතා විමසා කටයුතු කිරීම ශිෂ්‍ය ජීවිතයේ දී ම ඇරඹිය යුතු බව

- නිවැරදි ව සිතීම හා විමසීම මගින් ජීවිතය ජය ගත හැකි බව
- සිතීම හා විමසීම මගින් නිර්මාණශීලී චින්තනය පුබුදු වන බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. කාලාම සූත්‍රයේ සඳහන් ඥාණ මාර්ග 10 පන්තියට ඉදිරිපත් කරන්න

කණ්ඩායම 2. කාලාම සූත්‍රයට අනුව යම් අදහසක් යහපත් යැයි පිළිගැනීමට ඉදිරිපත් කොට ඇති නිර්ණායක දක්වන්න.

කණ්ඩායම 3. සිතා බලා හා විමසීමෙන් යුතුව කටයුතු කිරීම සාර්ථක ශිෂ්‍ය ජීවිතයකට උපකාර වන ආකාරය පෙන්වා දෙන්න.

**ගෙදර පරිසරයෙන්** :

බුද්ධිමත්ව සිතා බලා තීරණ ගන්නා පරිසරයක් නිවස තුළ ගොඩනගන්න.

**නිපුණතාව 05** : ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 11.5.1** : බෞද්ධ සංකල්ප ඇසුරින් ශ්‍රී ලාංකික අනන්‍යතාව සුරකියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- ශ්‍රී ලාංකික අනන්‍යතාව පැහැදිලි කරයි.
- බෞද්ධ ඉගන්වීම් ඔස්සේ ගොඩනැඟිය යුතු ශ්‍රී ලාංකික අනන්‍යතාව කුමක්දැයි පෙන්වා දෙයි
- ශ්‍රී ලාංකික අනන්‍යතාව පෙන්නුම් කරන දෙබසක් නිර්මාණය කරයි.
- අන්‍යෝන්‍ය සුහදත්වයෙන් කටයුතු කරයි.
- මනුෂ්‍යත්වයේ ඒකත්වය පිළිගනිමින් සැමට සම අයිතිය තහවුරු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

මනුෂ්‍යත්වයේ ඒකත්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් ශ්‍රී ලාංකික අනන්‍යතාව සුරැකීමට මගපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- ජාතික කොඩිය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- එහි අංගවලින් අර්ථවත් වන කරුණු පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- මෙහි අනන්‍යතා ලක්ෂණ බුදු දහමෙන් පෝෂණය වී ඇති බව පැහැදිලි කරන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුදු දහම මනුෂ්‍යත්වයේ ඒකත්වය පිළිගන්නා බව
  - වාසෙට්ඨ සූත්‍රයෙන් මිනිසාගේ ඒකත්වය පැහැදිලි කරන බව
  - සතර සංග්‍රහ වස්තු, සිව්බඹ විහරණ හා පංචසීල ප්‍රතිපත්ති වැනි බෞද්ධ සංකල්ප ඇසුරෙන් ශ්‍රී ලංකාවේ අනන්‍යතාව පැහැදිලි වන බව
  - පරෝපකාරය, අසරණ සරණ වීම, සමානාත්මතාව අන්‍ය මත ඉවසීම හා ගරු කිරීම, ජාතික ආගමික සහජීවනය වැනි ඉගැන්වීම් මගින් ශ්‍රී ලාංකික අනන්‍යතාව තහවුරු වන බව
  - නිරතුරු ජාතික අන්‍යනතාවෙන් යුතු ව ක්‍රියා කළ යුතු බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. වාසෙට්ඨ සූත්‍රය ඇසුරෙන් මිනිසාගේ ඒකත්වය තහවුරු කරන ආකාරය පෙන්වා දෙන්න.

කණ්ඩායම 2. වාසෙට්ඨ සූත්‍රයේ ඉගැන්වෙන කරුණුවලට අනුව ශ්‍රී ලාංකික අනන්‍යතාව පෙන්වා දෙන්න.

කණ්ඩායම 3. බෞද්ධ සංකල්ප ඇසුරින් වර්තමාන ශ්‍රී ලාංකික අනන්‍යතාව සුරැකීම සඳහා කළ යුතු දේ ලැයිස්තුගත කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

විවිධ සංස්කෘතීන්ට ගරු කරමින් අන්‍ය ජාතිකයන් හා අන්‍ය ආගමිකයන් සමඟ සුහදත්වයෙන් කටයුතු කිරීමට දරුවා ද සමඟ යොමුවන්න.

**නිපුණතාව 06** : බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 11.6.1** : කර්මය පුනර්භවයට බලපාන ආකාරය ගවේෂණය කර පාපයෙන් වැළකී කුසල කර්මයන්හි යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- කර්මය සහ පුනර්භවය අර්ථ දක්වයි.
- කර්මය සහ පුනර්භවය අතර මනා සබඳතාවක් ඇති බව පිළිගනියි.
- චුල්ල කම්ම විභංග සූත්‍රය ඇසුරෙන් පුද්ගල විවිධත්වයට හේතු වන කරුණු වගුගත කරයි.
- ශිෂ්‍යයෙකු ලෙස යහපත් චර්යා රටා ගොඩනගා ගැනීමට ක්‍රියා කරයි.
- කර්මානුරූපී ව විපාක ලැබෙන බව දැන සදාචාරවත් ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

චුල්ලකම්ම විභංග සූත්‍රය ඇසුරින් කර්මය පුනර්භවයට හේතු වන බැව් දැන පවින් වැළකී කුසලයන්හි යෙදීමට මගපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- චුන්ද සූකරගේ කතා පුවත හෝ ඒ හා සමාන වත්මන් කතා පුවතක් සිසුන්ට ඉදිරිපත් කරන්න.
- එම කතා පුවතට අනුව විපාක ලැබීම කර්මානුරූපීව සිදුවන ආකාරය පැහැදිලි කරන්න.
- සූත්‍රානුගත දේශනා තුළ කර්ම සංකල්පය බුදුරජාණන් වහන්සේ පැහැදිලි කර ඇති බව පෙන්වා දෙන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - අප විසින් සිතා මතා තිදොරින් සිදු කරනු ලබන ක්‍රියා කර්ම නම් වන බව
  - කර්මය හා පුනර්භවය අතර සම්බන්ධතාවක් ඇති බව
  - චුල්ල කම්ම විභංග සූත්‍රයෙහි කර්මය හා විපාක පිළිබඳ ව විවරණය වන බව
  - කරනු ලබන කර්මයට අනුරූපව විපාක ලැබෙන බව
  - කර්ම විපාක දැන පාපයෙන් වැළකී කුසලයෙහි යෙදිය යුතු බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. චුල්ල කම්ම විභංග සූත්‍රය ඇසුරින් පුද්ගල විවිධත්වයට හේතු වන කරුණු වගුගත කරන්න.

කණ්ඩායම 2. චුල්ල කම්ම විභංග සූත්‍රය ඇසුරින් පුද්ගල සංවර්ධනයට අදාළ කරුණු පෙන්වා දෙන්න.

කණ්ඩායම 3. දස කුසල් තිදොරට අනුව වර්ග කර දක්වන්න.

කණ්ඩායම 4. කර්මය හා පුනර්භවය අතර සම්බන්ධය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

පව් පින් විශ්වාස කරන මානසික පරිසරයක් ඇති වන ක්‍රියාකාරකම්වල දරුවන් යොදවන්න.

**නිපුණතාව 06** : බුදුදහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 11.6.2** : පටිච්ච සමුප්පාද න්‍යායට අනුව සාංසාරික දුක තේරුම් ගෙන නිවැරදි ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීමට ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- ද්වාදසාංග පටිච්ච සමුප්පාදය පැහැදිලි කරයි.
- සෑම සංසිද්ධියක්ම හේතුඵල සබඳතාවට අනුව සිදුවන බව පිළිගනියි.
- ද්වාදසාංග පටිච්ච සමුප්පාදය අනුලෝම ව හා ප්‍රතිලෝම ව ලියා දක්වයි.
- සිසු ජීවිතයේ ජය ගැනීම් සඳහා ප්‍රතීත්‍ය සමුප්පාද න්‍යාය යොදා ගනියි.
- සමාජ ජීවිතයේ දී හමුවන ගැටලු බුද්ධිමත්ව නිරාකරණය කර ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

ද්වාදසාංග පටිච්ච සමුප්පාදය අනුව සංසාරික දුක තේරුම් ගෙන නිවැරදි ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීමට සිසුන් යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- මෑත කාලීනව සිදුවූ ස්වාභාවික සිදුවීම් මොනවා දැයි සිසුන්ගෙන් විමසන්න.
- එක් සිදුවීමක් තෝරා ගන්න.
- එම සිදුවීමට මුල් විය හැකි හේතු මොනවා දැයි සිසුන්ගෙන් අසන්න.
- සෑම සිදුවීමක ම හේතුඵල සබඳතාවක් ඇති බව පැහැදිලි කරන්න.
- බුදු දහමේ එන පටිච්ච සමුප්පාදයෙන් හේතුඵල සබඳතාව විවරණය වන බව පවසන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - පටිච්ච සමුප්පාද ධර්මය බුදු දහමේ මූලික ඉගැන්වීමක් බව
  - සාංසාරික දුක ඇතිවීම හා නැතිවීම පටිච්ච සමුප්පාද න්‍යාය තුළින් විග්‍රහ වන බව
  - පුද්ගල හා සමාජ ගැටලු නිරාකරණය පිණිස පටිච්ච සමුප්පාද න්‍යාය අදාළ කරගත හැකි බව
  - පටිච්ච සමුප්පාද න්‍යාය මැනවින් තේරුම් ගැනීමෙන් නිවැරදි චින්තන රටාවක් ගොඩනගා ගත හැකි බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. ද්වාදසාංග පටිච්ච සමුප්පාදය අනුලෝම ව අරුත් සහිත ව දක්වන්න.

කණ්ඩායම 2. ද්වාදසාංග පටිච්ච සමුප්පාදය ප්‍රතිලෝම ව අරුත් සහිත ව දක්වන්න.

කණ්ඩායම 3. පටිච්ච සමුප්පාද න්‍යායට අනුව ජීවිත ගැටලු සාර්ථකව විසඳා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

එදිනෙදා ජීවිතයේ පැන නගින ගැටලු හඳුනාගෙන, ඊට බලපෑ හේතු සොයා බලා, ඒවා විසඳා ගැනීමට සියලු දෙනාම සහයෝගයෙන් කටයුතු කරන්න.

**නිපුණතාව 06** : බුදුදහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 11.6.3** : බුදුදහමේ මූලික ඉගැන්වීම් පදනම් කර ගනිමින් තම ජීවිතය ඔපවත් කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- බුදු දහමේ මූලික ඉගැන්වීම් සමාලෝචනය කරයි.
- බුදු දහමේ මූලික ඉගැන්වීම් ඇසුරෙන් යහපත් ජීවිත දර්ශනයක් ගොඩනගා ගත හැකි බව පිළිගනියි.
- බුදු දහමේ මූලික ඉගැන්වීම් සංකල්ප සිතියමක් ඇසුරින් නිරූපණය කරයි.
- ජීවිත ජය ගැනීමට බුදු දහමේ මූලික ඉගැන්වීම් උපයෝගී කර ගනියි.
- නිවැරදි දැක්මෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

බුදු දහමේ මූලික ඉගැන්වීම් උපයෝග කර ගනිමින් ශිෂ්‍ය ජීවිතය ඔපවත් කර ගැනීමට මග පෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවේ පසුබිම විස්තර කරන්න.
- එම සූත්‍රයේ හරය චතුරාර්ය සත්‍ය බව පැහැදිලි කරන්න.
- චතුරාර්ය සත්‍යය මෙන්ම පටිච්ච සමුප්පාදය, කර්මය හා පුනර්භවය ද බුදු දහමේ මූලික ඉගැන්වීම් බව පැහැදිලි කරන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - බුදුදහමේ සුවිශේෂී කරුණු මූලික ඉගැන්වීම්වල අන්තර්ගත බව
    - දුක, දුකට හේතුව, දුකින් මිදීම හා දුකෙන් මිදෙන මග චතුරාර්ය සත්‍යයෙන් පෙන්වා දෙන බව
    - චතුරාර්ය සත්‍යය අවබෝධයෙන් පරිනිර්වාණයට පත්විය හැකි බව
    - කර්මය හා පුනර්භවය අතර සබඳතාවක් ඇති බව

- හේතුඵල සබඳතාව පටිච්ච සමුප්පාදයෙන් විස්තර වන බව
- බුදු දහමේ මූලික ඉගැන්වීම් හැදෑරීමෙන් නිවැරදි ජීවිත දර්ශනයක් ගොඩනඟා ගත හැකි බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

පහත දැක්වෙන එක් එක් මාතෘකා **කෙටියෙන් හඳුන්වා,** නිවැරදි ජීවන දැක්මක් ඇති කර ගැනීමට ඒවා උපකාර වන ආකාරය පෙන්වා දෙන්න.

කණ්ඩායම 1. චතුරාර්ය සත්‍යය

කණ්ඩායම 2. පටිච්ච සමුප්පාදය

කණ්ඩායම 3. කර්මය හා පුනර්භවය

**ගෙදර පරිසරයෙන්** :

ආහාර පාන ගැනීම, ඇඳුම් පැළඳුම් තෝරා ගැනීම, ගමන් බිමන් යෑම ආදී එදිනෙදා සිදු කරනු ලබන කටයුතුවල දී ප්‍රතිඵලය පිළිබඳ ව සිතා බලා නිවැරදි දේ කිරීමට දරුවන් යොමු කරන්න.

**නිපුණතාව 07** : ජීවී අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි.

**නිපුණතා මට්ටම 11.7.1** : ජීව අජීව පරිසරය පිළිබඳ බෞද්ධ ඇගයීම් මතු කරමින් පරිසර හිතකාමී ව ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- ජීව අජීව පරිසරය පිළිබඳ ව බෞද්ධ ඉගැන්වීම් ගෙන හැර දක්වයි.
- පරිසරයට හිතකාමී ව ක්‍රියා කළ යුතු බව පිළිගනියි.
- ජීව අජීව පරිසරය සුරක්ෂිත කිරීමට සැලසුම් කරයි.
- පරිසර හිතකාමී ලෙස ගෙවතු පරිසරය සකස් කරයි.
- පරිසර හිතකාමී ව කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

පරිසරය හා සම්බන්ධ බෞද්ධ ඉගැන්වීම් අධ්‍යයනය කොට පරිසර හිතකාමීව කටයුතු කිරීමේ වැදගත්කම අවධාරණය කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- සොඳුරු වන අරණක සහ ස්වාභාවික සුන්දර පරිසරයක දර්ශන ඇතුළත් පින්තූර කීපයක් පන්තියට ඉදිරිපත් කරන්න.
- සිසුන් සමඟ මේ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- මෙම පරිසරය ජීව හා අජීව වශයෙන් දෙයාකාර බව පෙන්වා දෙන්න.
- ජීව හා අජීව පරිසරයේ වැදගත්කම බුදුදහමේ ඉගැන්වෙන බව පැහැදිලි කරන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුදු සිරිතේ උපත, බුදුවීම හා පිරිනිවන් පෑම, පරිසරය මුල් වී සිදුවී ඇති බව
  - බුදුරජාණන් වහන්සේ අනිමිසලෝචන පූජාවෙන් බෝධීන් වහන්සේට කළගුණ සැලකූ බව
  - සේඛියා ධර්මවලින් පරිසරය සුරැකීමේ වැදගත්කම පෙන්වා දෙන බව
  - මල්පල සහිත උද්‍යාන සැකසීම, වන වගා කිරීම, ඒදඬු පාලම් තැනීම, පැන් හල්, පැන් පොකුණු හා ආවාස සකස් කිරීම දිවා රාත්‍රී පිං වැඩෙන ක්‍රියාවන් බව වනරෝප සූත්‍රයේ සඳහන් වන බව.

* පාසල් වත්ත හා තම නිවස ආශ්‍රිත පරිසරය, හිතකාමී ව සකස් කිරීම වැදගත් බව
* ජීව අජීව පරිසරයේ මනා පැවැත්ම මත මානවයාගේ ඉරණම තීරණය වන බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. බුදු දහමෙන් ජීව අජීවී පරිසරය ඇගයීමට ලක් කළ අවස්ථා කීපයක් ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 2. පාසල් පිරියතෙහි සුන්දරත්වය හා ඵලදායකත්වය සඳහා සැලසුමක් සකස් කරන්න.

කණ්ඩායම 3. ජීව අජීව පරිසරය මනා ලෙස රැක ගැනීමට පාසල් සිසුන් වශයෙන් ඔබට ගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

නිවස ඇතුළත හා අවට පරිසරය නිසිලෙස නඩත්තු කිරීමටත් පිරිසිදුව හා ක්‍රමවත් ව පවත්වා ගැනීමටත් දරුවන් යොමු කරන්න.

**නිපුණතාව 07** : ජීවි අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි.

**නිපුණතා මට්ටම 11.7.2** : බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් හෙළි වන නීරෝගී දිවි පෙවෙත වටහා ගෙන කායික මානසික සමබරතාවක් ඇති කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි

**ඉගෙනුම් පල** :

- නීරෝගී දිවි පෙවෙතක් ගත කිරීමට ඇවැසි බෞද්ධ ඉගැන්වීම් ඉදිරිපත් කරයි.
- කායික මානසික සමබරතාවට බෞද්ධ ඉගැන්වීම් ගුරු කොට ගත හැකි බව පිළිගනියි.
- බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් නීරෝගීතාව පවත්වා ගැනීමට අවශ්‍ය තොරතුරු ඇතුළත් දහම් පත්‍රිකාවක් සකස් කරයි.
- තම පවිත්‍රතාව පිළිබඳ ව සැලකිලිමත් වෙයි.
- නීරෝගීමත් ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

සම්බුද්ධ දේශනා, ශ්‍රාවක- ශ්‍රාවිකා භාෂණ, ධම්මපදය, විනය නීති හා ථෙර ථෙරී ඉගැන්වීම් හැඳින, ඒවා අධ්‍යයනයෙන් කායික - මානසික සමබරතාවක් ඇති කර ගැනීමට මගපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- ''ආරෝග්‍ය පරමාලාභා - සන්තුට්ඨී පරමං ධනං ............'' ධම්ම පද ගාථාව නිවැරදි ව ලියූ පුවරුව පන්තියට ඉදිරිපත් කරන්න.
- එය සිසුන් සමඟ සජ්ඣායනය කරන්න.
- පරම ලාභය නීරෝගීකම බව මෙම ගාථාව ඇසුරෙන් පැහැදිලි කරන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුදුදහමට අනුව නීරෝගිකම යනු යහපත් කායික - මානසික සමබරතාව බව
  - බෞද්ධ ඉගැන්වීම් මගින් නීරෝගිමත් දිවි පැවැත්මකට අවශ්‍ය මගපෙන්වීම කරන බව
  - ශ්‍රාවක ශ්‍රාවිකා උදාන මගින් මානසික සමබරතාව අගය කර ඇති බව
  - ධම්ම පදය හා විනය නීති මගින් ද නීරෝගී දිවි පෙවෙතකට අවශ්‍ය මග පෙන්වීම් සිදුකර ඇති බව
  - යහපත් ජීවිතයක් ගත කිරීමට බෞද්ධ ඉගැන්වීම් ඉවහල් වන බව.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. බෞද්ධ ඉගැන්වීම්වලට අනුව නීරෝගී දිවි පෙවෙතක් ගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග පෙන්වා දෙන්න.

කණ්ඩායම 2. නීරෝගීතාව පවත්වා ගැනීමට අවශ්‍ය උපදෙස් ඇතුළත් දහම් පත්‍රිකාවක් පිළියෙල කරන්න.

කණ්ඩායම 3. බුදු දහමට අනුව කායික මානසික සබරතාවක් ඇති කර ගැනීමට ශිෂ්‍යයෙකු ලෙස ඔබ ක්‍රියා කළ යුතු අන්දම ඉදිරිපත් කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

නීරෝගිතාව සුරකෙන බෞද්ධ ප්‍රතිපත්ති හැඳින එම ප්‍රතිපත්ති අනුගමනය කිරීමට දරුවන් පොලඹවන්න.

**නිපුණතාව 08 :** ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 11.8.1 :** බෞද්ධ ථෙරවාදී සංගායනා අධ්‍යයනය කොට ථෙරවාද සම්ප්‍රදාය රැක ගැනීමට දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- බෞද්ධ ථෙරවාදී සංගායනා අධ්‍යයනය කරයි.
- බුදු සසුන රැක ගැනීමට සංගායනා ඉවහල් වූ බැව් පිළිගනියි.
- පළමු, දෙවන, තෙවන සහ මාතලේ අලුවිහාර සංගායනාවල වැදගත් කරුණු වගුගත කරයි.
- ගැටලු සහගත අවස්ථා සාකච්ඡා මගින් විසඳා ගනියි.
- බුදු දහමේ චිරස්තිථිය උදෙසා කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

පළමු, දෙවන, තෙවන හා මාතලේ අලුවිහාර සංගායනාව අධ්‍යයනය කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- වර්තමාන සමාජයේ ගැටලු විසඳා ගන්නා විවිධ ක්‍රම පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- ඉදිරිපත් වන ශිෂ්‍ය අදහස් විමසුමට ලක් කරන්න.
- '' සාකච්ඡා ක්‍රමය '' වඩාත් වැදගත් බව තහවුරු කරන්න.
- සාමූහික සාකච්ඡාව - සංගායනාව බව තහවුරු කරන්න.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුදු සසුනේ අර්බුදකාරී අවස්ථා මතු වූ විට සංගායනා පැවැත්වීමෙන් එම අර්බුද සමථයකට පත් කර ගැනීමට හැකි වූ බව
  - ථෙරවාදී සංගායනා තුනක් භාරතය මුල් කොටගෙන පැවැත්වූ බව
  - මාතලේ අලුවිහාර සංගායනාවෙන් ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළ බව.
  - බුදු සසුනේ චිරස්තිථියට සංගායනා හේතු වූ බව.

- සසුන තුළ උද්ගත වූ කාලීන ගැටලු විසඳා ගැනීමට සංගායනා හොඳම විසඳුමක් ලෙස බුදුරජාණන් වහන්සේ අනුමත කර ඇති බව
- වර්තමානයේ ඇති වන ගැටලු විසඳා ගැනීමට ද සාකච්ඡා ක්‍රමය වඩාත් සුදුසු බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. පළමු, දෙවන සහ තෙවන සංගායනා පැවැත්වීමට මූලික වූ හේතු, පැවැත්වූ ස්ථානය, ප්‍රධානත්වය, දායකත්වය, සංගායනා කළ කරුණු, අන්වර්ත නාමය, සහභාගි වූ පිරිස, පැවැත්වූ කාලය, පැවැත්වීමට ගත වූ කාලය, සංගායනාවේ ප්‍රතිඵල වගුගත කරන්න.

කණ්ඩායම 2. මාතලේ අලුවිහාර සංගායනාව පිළිබඳ සුවිශේෂී කරුණු පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. ඔබට ගැටලුවක්, උද්ගත වූ විට, එය විසඳා ගැනීමේ දී ''සංගායනා සංකල්පය'' මුල් කොට ගෙන ගැටලු නිරාකරණය කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

නිවස තුළ ඇති වන ගැටලු සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනීමට දරුවා සමඟ යොමුවන්න.

**නිපුණතාව 08 :** ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 11.8.2 :** මහින්දාගමනයෙන් ශ්‍රී ලාංකික ජන ජීවිතය ඔපවත් වූ ආකාරය අගයමින් සරල හා දැහැමි දිවි පෙවෙතකට හුරුවෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- මහින්දාගමනයේ සහ දුමින්දාගමනයේ වැදගත්කම පැහැදිලි කරයි.
- ශ්‍රී ලාංකික ජන ජීවිතය ඔපවත් වීමට මහින්දාගමනය හේතු වූ බැව් පිළිගනියි.
- මහින්දාගමනයෙන් සහ දුමින්දාගමනයෙන් ලත් දායාද වගුගත කරයි.
- සරල - දහැමි දිවි පෙවෙතක් ගත කරයි.
- බෞද්ධ සංස්කෘතික දායාද රැක ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

මහින්දාගමනයෙන් සහ දුමින්දාගමනයෙන් ලත් දායාද සහ පුද සිරිත් අගයමින් සරල දිවි පෙවෙතකට හුරු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- තිස්ස රජ සහ මිහිඳු මහ රහතන් වහන්සේ අතර ඇති වූ දෙබස ඇසුරින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- එම දෙබස මිහිඳු මහ රහතන් වහන්සේ සහ තිස්ස රජු අතර ඇති වූ පළමු සංවාදය බව පෙන්වා දෙන්න.
- ශ්‍රී ලාංකික පුනර්ජීවනයට මහින්දාගමනය පදනම් වූ ආකාරය පැහැදිලි කරන්න.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - මිහිඳු මහ රහතන් වහන්සේගේ වැඩම කිරීම මහින්දාගමනය බව
  - සඟමිත් තෙරණිය විසින් ශ්‍රී මහ බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව මෙරටට වැඩම කරනු ලැබීම දුමින්දාගමනය බව
  - මහින්දාගමනය සහ දුමින්දාගමනය හේතු කොට ගෙන පුද සිරිත් ඇතුළු දායාද රැසක් ශ්‍රී ලාංකික ජනතාවට උරුම වූ බව

* මෙම පුද සිරිත් සහ දායාද නොනැ සී මේ දක්වා පවත්වා ගෙන ආ බව
* ඒවා දැහැමි, සරල ජීවිතයකට හේතු වූ බව
* මේ සියල්ල හේතු කොට ගෙන බෞද්ධ සංස්කෘතියක් ගොඩනැගුණු බව
* මෙම පුද සිරිත් සහ දායාද මැනවින් පවත්වා ගැනීම සහ අනාගත පරපුරට පවරා දීම වර්තමාන අප සතු වගකීමක් බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. මහින්දාගමනය හා දුමින්දාගමනය කෙටියෙන් හඳුන්වන්න.

කණ්ඩායම 2. මහින්දාගමනයෙන් හා දුමින්දාගමනයෙන් ලත් දායාද සහ පුද සිරිත් ලේඛනගත කරන්න.

කණ්ඩායම 3. මහින්දාගමනය සහ දුමින්දාගමනය ඇසුරින් ශ්‍රී ලාංකීය ජනතාව සරල සහ දැහැමි දිවියකට හුරු වූ අයුරු පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

දරුවන් සමඟ යන වන්දනා ගමන් සංස්කෘතික දායාදයන් නිවැරදි ව හඳුනා ගත හැකි අයුරින් සංවිධානය කරන්න.

**නිපුණතාව 08** : ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 11.8.3** : ශාසන ඉතිහාසයෙන් උරුම වූ මූර්ති හා චිත්‍ර අගයමින් සංරක්ෂණය කිරීමට දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- ශාසන ඉතිහාසයෙන් උරුම වූ චිත්‍ර සහ මූර්තිවලට නිදසුන් සපයයි.
- මෙම දායාද සංරක්ෂණය කර ගත යුතු බව පෙන්වා දෙයි.
- ප්‍රතිමා, ප්‍රතිමා සර, මුද්‍රා, ආසන සහ මහනුවර යුගයේ හා නූතන යුගයේ චිත්‍ර, රූප සටහන් මගින් නිරූපණය කරයි.
- ශාසනික උරුමයන් හඳුනා ගැනීමට අධ්‍යාපන හා වන්දනා චාරිකා යොදා ගනියි.
- ශාසනික උරුමයන් සංරක්ෂණය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

ශාසන ඉතිහාසයෙන් උරුම වූ ප්‍රතිමා වර්ග, ප්‍රතිමාවල ආසන හා මුද්‍රා, ප්‍රතිමා සර, මහනුවර යුගයේ හා නූතන යුගයේ චිත්‍ර පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- මහනුවර යුගයේ හා නූතන යුගයේ චිත්‍ර කීපයක් හෝ මූර්ති කීපයක් සිසුන්ට පෙන්වන්න.
- මේ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- කලා අංග අතර මූර්ති හා චිත්‍ර වැදගත් බව පෙන්වා දෙන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - ප්‍රතිමා වර්ග ලෙස හිටි පිළිම, හිඳි පිළිම සහ සැතපෙන පිළිම වර්ග තුනක් හඳුනා ගත හැකි බව
  - හිටි පිළිම සහ හිඳි පිළිම ආබද්ධ සහ අනාබද්ධ ලෙස වර්ග කළ හැකි බව
  - සැතපෙන පිළිම සහ පරිනිර්වාණ පිළිම ලෙස සැතපෙන පිළිම වර්ග දෙකකින් නිරූපනය වන බව

- හිඳි පිළිම නෙළීමේ දී ආසන වර්ග හතරකින් නිරූපණය වන බව (වීරාසන, වජ්‍රාසන, පද්මාසන සහ භද්‍රාසන)
- පිළිම නෙළීමේ දී මුද්‍රා හයක් නිරූපණය වන බව
  (අභය මුද්‍රාව, ධ්‍යාන මුද්‍රාව, භූමි ස්පර්ෂ මුද්‍රාව, වරද මුද්‍රාව, විතර්ක මුද්‍රාව හා ධම්මචක්ක මුද්‍රාව .............. )
- මහනුවර හා නූතන යන යුග දෙකෙහිම චිත්‍ර දක්නට ලැබෙන බව
- මහනුවර යුගයේ චිත්‍ර මුළුමනින් ම පාහේ දේශීය ආරක් ගෙන ඇති බව
- ශාසන ඉතිහාසයෙන් උරුම වූ මූර්ති හා චිත්‍ර රැක ගැනීමට දායක විය යුතු බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව කටයුතු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. බුද්ධ ප්‍රතිමා සහ ප්‍රතිමාවල ආසන රූ සටහන් මගින් ඇඳ පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. ප්‍රතිමාවල මුද්‍රා සහ ප්‍රතිමා සර රූ සටහන් මගින් ඇඳ පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. මහනුවර සහ නූතන යුගයේ චිත්‍ර වෙන වෙනම හඳුන්වන්න.

කණ්ඩායම 4. ශාසන ඉතිහාසයෙන් උරුම වූ මූර්ති සහ චිත්‍ර සංරක්ෂණයට ඔබට දායක විය හැකි ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

විවිධ බුද්ධ ප්‍රතිමා සහ ප්‍රතිමා සර නිරූපණය කෙරෙන ඡායාරූප හෝ රූප රාමු එකතුවක් සකස් කරන්න.

**නිපුණතාව 08** : ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 11.8.4** : බුදු දහම ඇසුරින් පෝෂණය වූ සිංහල සාහිත්‍යය රසාස්වාදය කරමින් එහි සංරක්ෂණයට දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- යාපහුව, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ, මහනුවර සහ නූතන යුගයන්හි සාහිත්‍ය කෘති නම් කරයි.
- බුදු දහම ඇසුරින් සිංහල සාහිත්‍යය පෝෂණය වූ බව පිළිගනියි.
- යාපහුව සිට නූතන යුගය දක්වා බිහිවූ සාහිත්‍ය කෘති යුග වශයෙන් වෙන් කොට දක්වයි.
- සාහිත්‍ය රසාස්වාදනයෙහි යෙදේ
- නිර්මාණකරණයට යොමු වේ.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

යාපහුව, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ, මහනුවර සහ නූතන යුගයන්හි ගද්‍ය පද්‍ය සාහිත්‍යය හැඳින රස විඳීමටත්, ඒවා සුරක්ෂිත කිරීමටත් සිසුන් නැඹුරු කරවීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- යාපහුව, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ, මහනුවර ආදී නිර්දිෂ්ට යුගයකට අයත් කෘතියක් සිසුන්ට ඉදිරිපත් කරන්න.
- එම කෘතිය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- මෙවැනි ගද්‍ය හෝ පද්‍ය කෘති රැසක් අප සතුව ඇති බවත් කුඩා කළ සිටම එම කෘති කියවා රස විඳීමට පුරුදු වීම වැදගත් බවත් පෙන්වා දෙන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - යාපහුව, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ, මහනුවර සහ නූතන යුගයන්හි සාහිත්‍යය බුදු දහමින් පෝෂණය වී ඇති බව.
  - ඒ ඒ යුගයට අයත් ගද්‍ය / පද්‍ය කෘති වෙන් කොට දැක්විය හැකි බව

• අදාළ කෘතීන් රස වින්දනය කළ හැකි බව
• සාහිත්‍ය රසයෙන් යුතු කෘතීන්හි කතුවරුන් මනා ප්‍රතිභාපූර්ණත්වයෙන් යුතු වූ බව
• නව නිර්මාණකරණයේ දී මෙවැනි සාහිත්‍ය කෘති ගුරු කොට ගත හැකි බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම් 1 හා 2 කණ්ඩායම් නිර්දිෂ්ට කාර්යය සඳහා පහත සඳහන් වගුව භාවිත කරන්න.

| යුගය | සාහිත්‍ය කෘතිය | ගද්‍ය | පද්‍ය | රචක | අන්තර්ගතය |
|---|---|---|---|---|---|
| | | | | | |

කණ්ඩායම 1. යාපහුව, කුරුණෑගල, ගම්පොළ යුගයන්හි බුදු දහම ආභාසයෙන් පෝෂිත, සිංහල ගද්‍ය පද්‍ය කෘති වෙන් කොට දක්වන්න

කණ්ඩායම 2. කෝට්ටේ, මහනුවර සහ නූතන යුගයන්හි බුදු දහම ආභාසයෙන් පෝෂිත, ගද්‍ය හා පද්‍ය කෘති යුග වශයෙන් වෙන් කොට දක්වන්න.

කණ්ඩායම 3. සාහිත්‍ය කෘති පරිශීලනයෙන් ජීවිතයකට ලැබෙන ප්‍රයෝජන හඳුන්වා දෙන්න.

කණ්ඩායම 4. සිංහල සාහිත්‍ය (ගද්‍ය/ පද්‍ය) කෘති සංරක්ෂණය සඳහා ඔබ දායක වන ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

විවේක අවස්ථාවන්හි දී දරුවාට පැරණි පොත පත පරිශීලනයට අවස්ථාව සලසන්න.

**නිපුණතාව 09** : බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 11.9.1** : රැකියා නියුක්තියේ දී හා මුදල් පරිහරණයේ දී ධාර්මික ක්‍රමෝපායයන් පිළිබඳ මූලික හුරුව ලබයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- චතුර්විධ සැප හා ධාර්මික ධනෝපායනය කුමක්දැයි පැහැදිලි කරයි.
- උපයන ධනය ධාර්මික විය යුතු බව පෙන්වා දෙයි.
- ''ධාර්මිකව ධනය ඉපයීමේ වැදගත්කම'' යන මාතෘකාව යටතේ ලිපියක් ලියයි.
- ශ්‍රමාභිමානීව කටයුතු කරයි.
- මානසික සුවය අත් විඳියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

බුදු දහමේ ඉගැන්වෙන චතුර්විධ සැප හැඳින ගැනීමටත් ධනෝපායනය පිළිබඳ ධාර්මික ආකල්ප ඇති කර ගැනීමටත් මග පෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- අධාර්මික ව ධනය ඉපයීම හේතුවෙන් වරදකරුවකු බවට පත් වූ අයකුගේ තොරතුරු ඇතුළත් පුවත්පත් වාර්තාවක් ඉදිරිපත් කරන්න.
- මේ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ධාර්මිකව ධනය ඉපයීමේ වැදගත්කම බුදු දහම අවධාරණය කරන බව පැහැදිලි කරන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - ධනෝපායනයේ දී ධාර්මිකත්වය බුදු දහම අවධාරණය කරන බව
  - නිවැරදි ධන පරිහරණයෙන් චතුර්විධ සැප ලැබිය හැකි බව
  - අණන සූත්‍රය, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, සිගාලෝවාද සූත්‍රය, මහා මංගල සූත්‍රය ආදී සූත්‍රවලින් නිවැරදි ධනෝපායනය හා ධන පරිහරණය පිළිබඳ ව පැහැදිලි කෙරෙන බව

- රැකියා නියුක්තියේ දී හා මුදල් පරිහරණයේ දී ධාර්මික වීමෙන් නිවැරදි ප්‍රතිඵල ලැබිය හැකි බව
- ධනෝපායනයේ දී ශ්‍රමාභිමානය බුදු දහම අවධාරණය කරන බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. බුදු දහමේ ඉගැන්වෙන පරිදි ධාර්මික ධනෝපායනයෙහි යෙදෙන ආකාරය පන්තියට ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 2. ගිහියකුට තිබිය යුතු චතුර්විධ සැප නම් කොට කෙටියෙන් හඳුන්වන්න.

කණ්ඩායම 3. රැකියාවක ධාර්මික ව නියැළීමට අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

චතුර්විධ සැපය නිවැරදි ව අත්විඳිමින් එය දරුවාට ද අනුගමනය කිරීමට යොමු කරන්න.

**නිපුණතාව 09** : බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 11.9.2** : උපයා ගත් ධනය තමාගේ හා අන්‍යයන්ගේ යහපත පිණිස යෙදවිය යුතු බව දැන ඊට අනුගත ව ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- අංගුත්තර නිකායේ පත්තකම්ම සූත්‍රයේ දැක්වෙන ප්‍රාප්ත කර්ම පහ පැහැදිලි කරයි.
- උපයා ගත් ධනය තමාගේ හා අන්‍යයන්ගේ යහපත සඳහා යෙදවිය යුතු බව පිළිගනියි.
- පත්තකම්ම සූත්‍රයේ ප්‍රාප්ත කර්ම රූප සටහනක් මගින් නිරූපණය කරයි.
- තමා උපයන සම්පත් අර්ථවත් ව පරිහරණය කරයි.
- අරපිරිමැස්මෙන් පරිභෝජනය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

පත්තකම්ම සූත්‍රයේ ප්‍රාප්ත කර්මවලට අනුව උපයා ගත් ධනය පරිහරණය කිරීමට සිසුන්ට මග පෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- විශාරද එඩ්වඩ් ජයකොඩි මහතා ගයන ''හරි හම්බ කරපු දේවල් දුක් මහන්සියෙන් '' යන ගීතය සිසුන් සමග තාලයට ගයන්න.
- උපයන ලද ධනය තමාගේ සහ අන්‍යයන්ගේ යහපතට යෙදවූ පුද්ගලයකුගේ ප්‍රකාශයක් මෙම ගීතයෙන් පැවසෙන බව.
- උපයන ලද ධනය අර්ථවත් ව විය පැහැදම් කිරීම බුදු දහමේ ප්‍රාප්ත කර්ම යනුවෙන් හැඳින්වෙන බව.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - අංගුත්තර නිකායේ පත්තකම්ම සූත්‍රයේ ප්‍රාප්ත කර්ම පිළිබඳ ව සඳහන් වන බව.
  - ධනය පරිභෝජනයේ දී නිවැරදි ව සිදු කළ යුතු ආකාරය දහමින් මනාව පෙන්වා දී ඇති බව.
  - වර්තමාන සමාජයේ අප ද ප්‍රාප්ත කර්මවලට අනුව කටයුතු කළ යුතු බව.

- තමාගේ සහ අන්‍යයන්ගේ යහපතට උපයන ධනය යෙදවීමෙන් තෘප්තිමත් ජීවිතයක් ගත කළ හැකි බව.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. පත්තකම්ම සූත්‍රයේ සඳහන් ප්‍රාප්ත කර්ම චාර්ට් සටහනක් මගින් පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. උපයා ගත් ධනය තමාගේ හා අන්‍යයන්ගේ යහපත සඳහා යෙදවිය හැකි ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. උපයා ගත් ධනය තමන් සඳහා සහ අනුන් සඳහා යෙදවීමෙන් සැලසෙන යහපත පෙන්වා දෙන්න.

**ගෙදර පරිසරයෙන්** :

ප්‍රාප්ත කර්මවලට අනුව ධනය වියදම් කොට එහි වැදගත්කම දරුවන් සමග සාකච්ඡා කරන්න.

**නිපුණතාව 09** : බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 11.9.3** : බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති අධ්‍යයනය කොට තම ජීවිතයේ නායකත්ව අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති පැහැදිලි කරයි.
- නායකත්ව අවස්ථාවන්ට මුහුණ දීමේ දී බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති ගුරු කොට ගත හැකි බව පෙන්වාදෙයි.
- දස රාජ ධර්ම, සිව්බඹ විහරණ, පංචසීල ප්‍රතිපත්තිය ලැයිස්තුගත කරයි.
- නිවැරදි නායකත්වයට ගරු කරයි.
- දෛනික ක්‍රියාකාරකම්හි දී නායකත්ව ලක්ෂණ පෙන්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

දස රාජ ධර්ම, පංච සීලය, සිව් බඹ විහරණ යන බෞද්ධ පාලන ප්‍රතිපත්ති ඇසුරෙන් නායකත්ව අවස්ථාවන්ට සිසුන් පුහුණු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- ''දන්න වංහුං අප කන්න සාමි රාජ දූරයේ ......................... '' යන නූර්ති ගීතය පන්තියට ඉදිරිපත් කරන්න.
- ගීතය ශ්‍රී වික්‍රම නූර්තියට අයත් ගීතයක් බව.
- මේ මගින් රජුගේ ධාර්මික ක්‍රියා කලාපය ප්‍රකාශ වන බව.
- ධාර්මික පාලනයට බුදු දහම මග පෙන්වන බව.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - රාජ්‍ය පාලන ප්‍රතිපත්ති අතර දස රාජ ධර්ම, පංචසීලය, සිව්බඹ විහරණ වැදගත් වන බව.
  - සිගාලෝවාද සූත්‍රය, චක්කවත්ති සිහනාද සූත්‍රය, රාජෝවාද ජාතකය යන මූලාශ්‍රයවල බෞද්ධ පාලන ප්‍රතිපත්ති ඇතුළත් වන බව.

- සදාචාරවත් සමාජයක් බිහිවීමේ පදනම ධාර්මික රාජ්‍ය පාලනය බව.
- පාලකයා ජනතාවට පියෙකු ලෙස කටයුතු කළ යුතු බව.
- ආයතනික නායකත්ව භූමිකාවල දී මෙම ඉගැන්වීම් ගුරු කොට ගත හැකි බව.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

පහත දැක්වෙන බෞද්ධ ඉගැන්වීම් රාජ්‍ය පාලන ප්‍රතිපත්තියක් ලෙස යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 1. දස රාජ ධර්ම

කණ්ඩායම 2. පංචසීලය

කණ්ඩායම 3. සිව්බඹ විහරණ

කණ්ඩායම 4. තමා තුළ නායකත්ව ලක්ෂණ ගොඩනගා ගැනීමේ දී බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති ඉවහල් කර ගත හැකි අන්දම පෙන්වා දෙන්න.

**ගෙදර පරිසරයෙන්** :

නිවස තුළ නිවැරදි නායකත්වයක් ගොඩනැගීමෙන් දියුණුව සැලසෙන අයුරු අත්දැක දරුවන් ද ඊට යොමු කරන්න.

**නිපුණතාව 10 :** නිර්වාණය අරමුණු කොට ගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි.

**නිපුණතා මට්ටම 11.10.1:** නිර්වාණගාමී ප්‍රතිපදාවේ සුවිශේෂත්වය තේරුම් ගෙන එම ප්‍රතිපදාවේ නියැළෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- නිර්වාණගාමී ප්‍රතිපදාවේ දී සම්මා දිට්ඨිය පූර්වාංගම වන ආකාරය පැහැදිලි කරයි.
- ශික්ෂණය සඳහා සම්මා දිට්ඨියේ අවශ්‍යතාව පෙන්වා දෙයි.
- '' සම්මා දිට්ඨිය නිවන් මගෙහි පදනමයි'' යන මැයෙන් පුවත්පත් ලිපියකට අවශ්‍ය කරුණු පෙළගස්වයි.
- නිවැරදි දැක්මෙන් ක්‍රියා කරයි.
- ලොවී ලොව්තුරා සුව පිණිස කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

සම්මා දිට්ඨිය පෙරටු කොට නිර්වාණගාමී ප්‍රතිපදාවේ නියැලීමට සිසුන්ට මගපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- සිදුහත් කුමරු සතර පෙර නිමිති දැකීම පිළිබඳ පහත කරුණු මතු කරමින් සිසුන් සමග සාකච්ඡා කරන්න.
- සතර පෙර නිමිතිවල මුල් අංග තුනෙන් ජීවිතයේ යථා ස්වභාවය පෙන්වා දෙන බව පැහැදිලි කරන්න.
- ජීවිතයේ යථා ස්වභාවය නිවැරදි ව දැකීම සම්මා දිට්ඨිය බව පෙන්වා දෙන්න.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බෞද්ධ ශික්ෂණ මාර්ගය සම්මා දිට්ඨියෙන් ආරම්භ වන බව
  - ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාවට බෙදා දැක්වීමේ දී සම්මා දිට්ඨිය, ප්‍රඥාවට අයත් වන බව
  - සම්මා දිට්ඨිය, ලෞකික සහ ලෝකෝත්තර ලෙස දෙයාකාර බව
  - සදාචාරවත් ජීවිතයකට සම්මා දිට්ඨිය ඉතා වැදගත් බව
  - නිවැරදි දක්මෙන් යුතුව කටයුතු කිරීම මඟින් ලෞකික ජීවිතය ජය ගත හැකි බව
  - ලෝකෝත්තර තත්ත්වයට පත් වීම සඳහා සම්මා දිට්ඨිය මූලික වන බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. ආර්යාෂ්ටාංගික මාර්ගය තුළ සම්මා දිට්ඨිය අනෙකුත් මාර්ගාංගයන්ට පූර්වාංගම වන ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. සදාචාරවත් ජීවිතයට සම්මා දිට්ඨියේ ඇති වැදගත්කම පෙන්වා දෙන්න.

කණ්ඩායම 3. පාසල් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයෙකු ලෙස නිවැරදි දැක්මෙන් යුතුව කටයුතු කිරීම මඟින් ලබා ගත හැකි යහපත් ප්‍රතිඵල පෙන්වා දෙන්න.

**ගෙදර පරිසරයෙන්** :

එදිනෙදා කටයුතු නිවැරදි දැක්මකින් යුතුව සිදු කිරීමෙන් යහපත සිදුවන බව දරුවන්ට දැනෙන ආකාරයට නිවසේ කටයුතු සංවිධානය කරන්න.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

බුදුරජාණන් වහන්සේ ධරමාන සමයෙහි ම භාවිත කොට නිශ්චිත ප්‍රතිඵල විධිමත් ව ලබාගත් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදයක් අප සතු ව ඇත. බුද්ධ ධර්මය විෂය ඉගැන්වීමේ ක්‍රමවේදය තීරණය කිරීමේ දී සිසු නිපුණතා සංවර්ධනය වන පරිදි සැලසුම් සම්පාදනයට වැඩි අවධානයක් යොමු කර ඇති නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමයේ දී ගුරු භූමිකාවේ සුවිශේෂ වෙනසක් තුළින් ප්‍රබෝධාත්මක, සක්‍රීය ඉගෙනුම් ක්‍රියාවල යෙදෙන ඉගෙනුම්ලාභීන් ඔවුන්ට කේන්ද්‍ර ගත වූ ක්‍රියාවලියකට නිසැක වශයෙන් ම පත්වනු ඇත.

දැනට පන්ති කාමරයේ ක්‍රියාත්මක වන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය සිසු - සිසු අන්තර් සම්බන්ධතා සංවර්ධනය වන අයුරු සකස් විය යුතු වේ. සරලත්වයෙන් සංකීර්ණත්වයට, සංයුක්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් යොමු කිරීම ගුරුවරයාගේ කාර්යය වේ. මෙහිදී ගුරු භවතා සම්පත්දායකයකුගේ තත්වයෙන් ක්‍රියා කිරීම අත්‍යවශ්‍යයි. ඉගෙනුම් පරිසරය සැලසුම් කිරීම, සිසුන්ගේ ඉගෙනුම් නිරීක්ෂණය, ශිෂ්‍ය දක්ෂතා හඳුනා ගැනීම, ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබාදීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැරට ඉගෙනුම ව්‍යාප්ත වන අයුරු කටයුතු සංවිධානය ගුරුභවතාගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පරිණාමන ගුරු භූමිකාව ගුරුවරයා වෙතින් ප්‍රදර්ශනය විය යුතු ය. විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ ඉදිරිපත් කරනු ලබන මෙම විෂයමාලාව හා සම්බන්ධ ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ දී පරිණාමන ගුරු භූමිකාවට අමතරව, සම්ප්‍රේෂණ හා ගනු දෙනු භූමිකාවන්හි ඇතුළත් වැදගත් ලක්ෂණ භාවිතයට ගැනීමට ද ගුරුභවතා සමත් විය යුතු ය.

බුද්ධ ධර්මය විෂය මගින් ධර්මය ආත්මීකරණය කොට දැහැමි ක්‍රියාකාරකම් මාලාවක් ජීවිත උරුමයක් සේ සම්පාදනය කිරීම සඳහා ගුරු දායකත්වය මහෝපකාරී වේ. එහි දී ධර්මයට අනුගත ව ජීවත්වීමේ අවශ්‍යතාව ප්‍රකටව සාකච්ඡා කෙරුණ ද, එය ජීවිත අත්දැකීමක් බවට පත්කර ගැනීම දකින්නට ලැබෙන්නේ අඩු ප්‍රතිශතයකිනි. ඒ නිසා පන්ති කාමරයේ ඉගැන්වෙන බුද්ධ ධර්මය විෂය අන්තර්ගතය, ඉන් බැහැර සමාජයේ දී ද සිය ජීවිතයට චරිතායනය කර ගැනීමට ශිෂ්‍ය ප්‍රජාවට මග පෙන්වීම අත්‍යවශ්‍ය ය. ඒ සඳහා යොමු විය හැකි ක්‍රමමෝපායයන් කිහිපයක් මෙසේ දැක්විය හැකි ය.

- නිවසේ ආගමික වත් පිළිවෙත් හි නිරත කරවීම.
- පාසලෙහි ආගමික වතාවත්වලට ක්‍රියාකාරීව සහභාගිවීමට සැලැස්වීම.
- බෞද්ධ උත්සවයන්හි දී ආමිස පූජාවන්හි මෙන් ම ප්‍රතිපත්ති පූජාවෙහි වැඩි නැඹුරුවකින් නිරතවීමට විධිවිධාන යෙදීම.
- පාසල අයත් ප්‍රදේශයේ හෝ ශිෂ්‍යයා පදිංචි ප්‍රදේශයේ හෝ විහාරස්ථාන ඇසුරින් ආගමික කටයුතුවල නිරතවීමට මග පෙන්වීම.
- දහම් පාසල් අධ්‍යාපනයට නැඹුරු කරවීම.
- වැඩිහිටි නිවාස, රෝහල් ආදියේ උපස්ථාන කටයුතු හා ශ්‍රමදාන කටයුතුවලට යොමු කිරීම.

- පරිසරයේ වටිනාකම තේරුම් ගෙන ඒ අනුව කටයුතු කිරීමට සැලැස්වීම.
- සමාජ සුභසාධන ස්වේච්ඡා සමිති සමාගම්වලට සහභාගීවීමට හා ඒවායේ නිලතල දැරීමට උනන්දු කරවීම.

මේ ආදි ක්‍රමෝපායයන් මගින් පන්ති කාමරයේ ලබන ඉගෙනුම, ජීවිත අත්දැකීමක් බවට පත්කර ගැනීමට අවස්ථාව ලැබෙන අතර, එමගින් තහවුරු කර ගත හැකි සාරධර්ම චරිතායනය කර ගැනීමට අවස්ථාව සැලසේ. ඒ සඳහා ශිෂ්‍යයා යොමු කරවීම බුද්ධ ධර්මය විෂය උගන්වන ගුරු භවතාට  පැවරෙන වැදගත් යුතුකමක් ද වේ.

### පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

1. සෑම පුර පසළොස්වක පෝය දින හෝ එම පෝයට පෙර දින හෝ සුවිශේෂ වූ ආගමික උත්සව සංවිධානය කිරීම.
2. පාසලේ / විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේලාගේ අවවාද අනුශාසනා ආගමික කටයුතුවලදී ලබා ගැනීම.
3. ආගමික වතාවත් ඉටු කිරීමේ දී ශිෂ්‍යයන්ගේ හැකියා සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.
4. සහයෝගය, සාමූහිකත්වය, අන්‍යෝන්‍ය ගෞරවය සුහද බව තහවුරු වන පරිදි ප්‍රායෝගික ක්‍රියාකාරකම් සැලසුම් කිරීම.
5. බෞද්ධ ශිෂ්‍ය සමිති පිහිටුවීම සහ ඒ මගින් ආදර්ශවත් නායකත්වයක් පුහුණු කිරීම.
6. අධ්‍යාපන චාරිකා, පර්යේෂණ ව්‍යාපෘති, දැනුම මිනුම තරග, චිත්‍ර ප්‍රදර්ශන, බිත්ති පුවත්පත්, වාර ප්‍රකාශන ආදී ක්‍රියාකාරකම් මගින් වැඩසටහන් සංවිධානය කිරීම.
7. දෙමාපියන් දැනුවත් කිරීමෙන් ශිෂ්‍ය හැකියා සංවර්ධනය කිරීම.

### තක්සේරුව හා ඇගයීම

1. වාර අවසාන පරීක්ෂණ ඇසුරින් විෂය පිළිබඳ ශිෂ්‍ය සාධනයෙ හි විධිමත් ඇගයීමක් අපේක්ෂා කෙරේ.
2. සෑම පාඩමක දී ම ශිෂ්‍යයන්ගේ සාධනය පිළිබඳ  තක්සේරු කිරීමට/ඇගයීමට  විෂය භාර ගුරු භවතා  උනන්දුවීම අත්‍යවශ්‍ය ය.
3. ඇගයීම පිළිබඳ ලිඛිත වාර්තා, ලිපිගොනු පවත්වා ගැනීම ද අවශ්‍ය වේ.
4. ප්‍රතිපෝෂණ වැඩ සටහන් සැලසුම් කිරීම ද අපේක්ෂා කෙරේ.
5. ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා ගුරු භවතාට යොදා ගත හැකි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.
    - සංකල්ප සිතියම්, බිත්ති පුවත්පත්,  ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන්
    - ප්‍රශ්න සහ පිළිතුරු පොත්, ශිෂ්‍ය කාර්ය සාධන ගොනු, සිසු නිර්මාණ
    - ප්‍රදර්ශන, විවාද, සාකච්ඡා මණ්ඩල,  සම්මන්ත්‍රණ, ක්ෂණික කථා
    - භූමිකා රංගන, සාහිත්‍ය විමසුම් ඉදිරිපත් කිරීම, ක්ෂේත්‍ර පොත්
    - ස්වභාව අධ්‍යයන දින පොත්, සාධුචර්යා පුස්තක, ප්‍රායෝගික පරීක්ෂණ

**විවිධ සහාය**

| | | |
|---|---|---|
| **කාර්යාලයීය කටයුතු** | : | එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය<br>කළමනාකරණ සහකාර<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>ඩයස් අමරසිංහ මහතා<br>කාර්යාල ආධාරක<br>ජාතික අධ්‍යාපන ආයතනය |